2024 ජුනි කලාපය

# සක් සද

සඳෝදුරත්වයේ කැටපත් පවුර

ගම්පහ බණ්ඩාරනායක විදුහලේ ආදි ශිෂ්‍ය සංගමයේ නිල පුවත් පත



## නායකයේ නායකත්වය ආදී නායකවරයෙකුට...

ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේ විදුහල්පති තනතුර සඳහා කසුන් ගුණරත්න මහතා පත්විය. ඒ මහතා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ කීර්තිමත් නිලධාරියකු වන අතර මෙම තනතුරට පත්වීමට පෙර හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ විදුහල්පතිවරයා ලෙස කටයුතු කර ඇත. 2003 වසර කණ්ඩායමේ කීර්තිමත් ආදි ශිෂ්‍යයකු වන එතුමා බණ්ඩාරනායක විද්‍යාලයේ 28 වන විදුහල්පතිවරයා වන අතර විද්‍යාලයට පත්වූ දෙවන ආදි ශිෂ්‍ය විදුහල්පතිවරයාද වේ. අධ්‍යාපන පරිපාලන නිලධාරියකු ලෙස අත්දැකීම් සපිරි නිලධාරියෙකු වන මෙතුමන්ට විද්‍යාලයේ අනාගතය නිවැරදි දිශාවට යොමු කරවීමට අවශ්‍ය ශක්තිය ධෛර්ය නොඅඩුව ලැබේවා යන්න අපගේ ප්‍රාර්ථනයයි.

## 105 වන සංවත්සරයට සමරු මුද්දරයක්....




විද්‍යාලයේ 105 වන සංවත්සරය වෙනුවෙන් පසුගිය සැප්තැම්බර් මස 18 වන දින විශේෂ සමරු මුද්දරයක් සහ කවරයක් නිකුත් කිරීම විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී සිදු කරන ලදී.

## A 9 -259 යි, අ.පො.ස. සා/පෙළින් වාර්තාගත ජයග්‍රහණයක්...

පසුගියවර පැවති 2023 අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සඳහා විද්‍යාලයේ සිසුන් 460 දෙනෙකු පෙනී සිටි අතර එම සියලුම සිසුන් සාමාන්‍ය පෙළ විභාගය සමත්ව ඇත. එහිදී A9 සාමාර්ථ 259 ක් ලබාගෙන දිවයිනේ සියලුම පාසල් අභිබවා යමින් වාර්තාගත ජයග්‍රහණයක් ලබා ගැනීමට බණ්ඩාරනායක පුතුන් සමත් වී ඇත. ඊට අමතරව A8 සාමාර්ථ 88 ක් සහ A7 සාමාර්ථ 44 ක් ද ලබාගෙන සමත් ප්‍රතිශතය 100%ක් ලෙස පවත්වා ගැනීමට විද්‍යාලය සමත්ව ඇත.

## "නැණ පහන" ශිෂ්‍යත්ව වැඩසටහන නැවතත්....

විද්‍යාලයේ අඩු ආදායම්ලාභී දරුවන්ගේ අධ්‍යාපනික කටයුතු නිසි ආකාරව සාර්ථක කර ගැනීම සඳහා ආදි ශිෂ්‍ය සංගමය විසින් ලබා දෙන පිටුවහලක් ලෙස "නැණ පහන" ශිෂ්‍යත්ව වැඩසටහන කලකට පෙර සිට සාර්ථකව ක්‍රියාත්මක වූ අතර මෑත කාලයේ වසර කිහිපයක කාලයක් තුළ එය අපේක්ෂිත අයුරින් ක්‍රියාත්මක කිරීමට අපහසු වූ බැවින් එම වැඩසටහන නැවතත් ක්‍රියාත්මක කිරීමට ආදි ශිෂ්‍ය සංගමය විසින් අවශ්‍ය සියලු කටයුතු සූදානම් කර ඇත.

X·Ban 2024

The pride of a victorious journey

**X Ban 2024** ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේ 106 වන සංවත්සරයට සමගාමීව පැවැත්වීමට නියමිත X Ban 2024 අධ්‍යාපනික, තාක්ෂණ, විද්‍යා ප්‍රදර්ශනය සහ සැණකෙලිය 2024 ජුලි මස 24 වන දා සිට 28 වන දා තෙක් අතිඋත්කර්ශවත් අයුරින් පැවැත්වීමට මේ වන විට කටයුතු සූදානම් කර ඇත. 1990 වසරේදී ඇරඹි මෙම ප්‍රදර්ශනය මෙවර පැවැත්වෙන්නේ 8 වන වතාවටය.

# සකිසඳ පුවත්පත

ආදි ශිෂ්‍ය සංගමය
බණ්ඩාරනායක විද්‍යාලය
ගම්පහ


## සංස්කාරක සටහන

සියනෑ පුරයෙ මැද
මිණි කිරුළ බුහුමන් ලද
පින්බර පුතුන් ලද
මවුනි නමදිම් බැතින් පා වැඳ

"කසුරි" ගෙන් දිවි ලද
"සකිසඳ"යි නම් ලද
පෙර පැවත එන ලද
පුවත්පත දැන් නැවත පණ ලද

විදුමවු තුරුලෙ හිඳ
සිප්කිරි බිඳෙන් බිඳ
බිවු මිතුරො කොහි වෙද
සබඳ, එපුවත් ඔබට මතකද

කලතා මතක හොඳ
නැවත බැඳෙමුද රොද
විදුමවු තුරුලෙ වැද
ගෙවු සමය ගැන කතා ලියමුද

මුද්‍රනය කෙරුමට
පිටුටික සැකසුමට
යවනා තැපෑලට
බොහෝ බර පැන වේය අපහට

වියදම පියවුමට
බිල්පත් ගෙවා ගැනුමට
අත දුන්නේ අපට
ආදි සොයුරන් තමා හැමවිට

සංස්කාරක ලෙස
පැවරූ වගකීම් රැස
කඩ නොකර දුන් බස
ඉටුකලෙමි මම මෙමට හැකි ලෙස

පණ දුන් සකිසඳට
මෙතුවක් දුන්න සවියට
අත දුන් ඔබ සැමට
පුදමි තුතිමල් මිටක් මෙලෙසට

**සංස්කරණය : තිලිණ ප්‍රියසාද්**



## බස්නාහිර පළාත් අණුශූරතාවය බණ්ඩාරනායකයට...



ඉදිරියේදී පැවැත්වීමට නියමිත හර්මන් ලෝස් කඳවුර සඳහා ජ්‍යෙෂ්ඨ බාලක ශිෂ්‍යභට බණ්ඩ තෝරා ගැනීම වෙනුවෙන් පැවති බස්නාහිර පළාත් කඳවුරේ අනුශූරතාවය දිනා ගැනීමට අප විද්‍යාලයීය ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභට බණ්ඩය සමත් වී ඇත. මෙහිදී 3 වන බලඇණිය නියෝජනය කරමින් කඳවුරුගතවූ කොළඹ ආනන්ද විද්‍යාලය පළමුවන ස්ථානයත්, 7 වන බලඇණිය නියෝජනය කරමින් කඳවුරුගතවූ ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලය දෙවන ස්ථානයත් 3 වන බලඇණිය නියෝජනය කරමින් කඳවුරුගතවූ කොළඹ නාලන්ද විද්‍යාලය තෙවන ස්ථානයත් හිමිකරගෙන ඇත.

කලක් 7වන බලඇණියේ පළමු ස්ථානය දිගින් දිගටම හිමිකරගෙන 7 වන බලඇණියේ කේසර සිංහයින් ලෙස විරුදාවලිය ලත් බණ්ඩාරනායක පුතුන් වසර 12 කට පසුව නැවත 7 වන බලඇණියේ පළමු ස්ථානයට පත්වීම සතුටට කරුණක් වන අතර ඉදිරියේදී පැවැත්වෙන හර්මන් ලෝස් කඳවුරේදී සමස්ත ලංකා ශූරයින් ලෙස අභිශේක ලබා හර්මන් ලෝස් කුසලානය බණ්ඩාරනායක විද්‍යාලයට ගෙන ඒමට අවශ්‍ය ශක්තිය ධෛර්යය නිබඳවම ලැබේවා යන්න සකිසඳ අපගේ පැතුමයි.

මෙම ජයග්‍රහණය පිටුපස සෙවනැල්ලක්ව සිටි විද්‍යාලයේ විදුහල්පති තුමන්ටත් ශිෂ්‍යභට කණ්ඩය බාරව කඳවුරුගතවූ කපිතාන් ශාන්ත කුඹලාතර ගුරුතුමන්ටත් ජයග්‍රහණය උදෙසා ශිෂ්‍යභට බණ්ඩය පුහුණු කළ අංජුල සුරේෂ් පෙරේරා සොයුරා ඇතුලු ආදි ශිෂ්‍යභට සංගමයටත්, දෙමවුපියන් ඇතුලු සහයෝගය ලබා දුන් සැමටත් සකිසඳ අපගේ ගෞරව ප්‍රණාමය පුදකර සිටිමු.

**තිලිණ ප්‍රියසාද්**

මෙම කාර්යය සාර්ථක කර ගැනීමට සහයෝගය ලබා දුන් ගරු විදුහල්පතිතුමන්ටත්, ආදි ශිෂ්‍ය සංගමය හා සම්බන්ධීකරණ කමිටුවටත්, වෙළඳ දැන්වීම් සඳහා අනුග්‍රහය ලබාදුන් ලසන්ත දීපාල් (87 කණ්ඩායම), ලලිත් ධම්මික (96 කණ්ඩායම), බුද්ධික සජිත් (2000 කණ්ඩායම), ලක්නාත් චතුරංග (2001 කණ්ඩායම) කෝසල දිසානායක (2003 කණ්ඩායම) යන ආදි බණ්ඩාරනායක සොයුරන්ටත්, සකිසඳට ලිපි සම්පාදනයෙන් දායක වූ ජ්‍යෙෂ්ඨ සොයුරන්ටත්, තොරතුරු ලබා ගැනීමේදී සහාය දැක්වූ ප්‍රධාන ශිෂ්‍යනායක ඉඳුවර දිනෙත් සොයුරාටත්, පුවත්පත සඳහා ඡායාරූප ලබාදුන් විද්‍යාලීය ඡායාරූප කලා සංගමයටත්, සෝදුපත් පරීක්ෂා කළ නිහාල් නානායක්කාර ජ්‍යෙෂ්ඨ සොයුරාටත්, ග්‍රැෆික් නිර්මාණ සහ පිටු සැකසුම් කළ චිරාත් ලබිත මහතාටත් (ඩිජිටල් මහගෙදර) අගනා නිමාවකින් මුද්‍රණ කටයුතු සිදු කර දුන් ආගර ප්‍රින්ටර්ස් අධිපති මධුර මහතාටත්

**ගෞරවණීය ස්තූතිය පුද කර සිටිමු.**

මෙම කාර්යය ආදි ශිෂ්‍ය සංගමයේ සම්බන්ධීකරණ කමිටුවේ සාමූහික ප්‍රයත්නයකි.

03 පිටුව



## ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේ නව නියමුවානන් ලෙස පත්වූ කසුන් ගුණරත්න මුල්ගුරුතුමන් සමග කරන ලද සංවාදයකි...

**ආයුබෝවන් විදුහල්පතිතුමනි. අපි මේ කතාවට ආරම්භයක් විදියට මුලින්ම ඔබතුමාගේ ළමා කාලයෙන් මේ සංවාදය ආරම්භ කලොත්...**

මම ඉපදුනේ 1984 අවුරුද්දෙ සැප්තැම්බර් 18 වෙනි දා. ඒක හරිම දෛවෝපාගත සිදුවීමක්. අපේ පාසලේ උපන් දිනය යෙදෙන්නෙත් එදාටමයි. මගේ ගම දිවුලපිටිය. මම මුලින්ම ඉගෙන ගත්තෙ දිවුලපිටිය කණිෂ්ඨ විද්‍යාලයෙ. ඒ පාසල දැන් හඳුන්වන්නේ දිවුලපිටිය ඥාණාවාස මහා විද්‍යාලය නමින්. එම පාසලෙන් 5 ශ්‍රේණිය දක්වා ඉගෙනගෙන 1995.3.23 වන දා බණ්ඩාරනායක විද්‍යාලයට ඇතුළත් උනා. මම සාමාන්‍ය පෙළ විභාගය ලියන්නේ 2000 වසරේ. ඊට පස්සේ 2003 වසරෙදි කලා අංශයෙන් උසස් පෙළ විභාගය සමත් උනා.

**ඔබතුමා පාසල් කාලයේදි ඉගෙනීමට අමතරව විෂය බාහිර වැඩත් ගොඩක් කලා කියලා මට මතකයි. ඒ ගැනත් මතක් කිරීමක් කලොත්..**

පාසල් කාලයේදි මම විෂය සමගාමී කටයුතු ගණනාවකම නිරත උනා. විවාද සංගමය, මාධ්‍ය ඒකකය සහ බෞද්ධ සංගමයට මම එකතුවෙලා හිටියා. විශේෂයෙන්ම බෞද්ධ සංගමයේ ලේකම් විදියටත් මම කටයුතු කලා. ඒවගේම විවාද තරඟ වලින් ජයග්‍රහණ ලබා ගත්තා. මම එකොලහ වසරෙදි "බුදු දහම හා යොවුන් ආකල්ප" කියලා පොතකුත් ලිවුවා. ශාස්ත්‍රීය ජීවිතයට නැඹුරුවක් ඇති වෙන්න ඒක හොඳ උත්තේජනයක් උනා.

ඒ කාලෙ අපිට ගුරුවරුන්ගෙන් ලැබුණු ආදරය, කරුණාව, අනුග්‍රහය, පන්නරය, අවධානය මේ හැමදෙයක්ම අපේ ජීවිත පොහොසත් කරන්න උදවු උනා වගේම අනාගතය පිළිබඳව අපේක්ෂා ගොඩනගන්න ලොකු උදවුවක් උනා. විශේෂයෙන්ම උසස් පෙළ අවධියේ දී අපිට කැඳවපු සම්පත්දායකයො පරමාදර්ශ විදියට අපි සලකන්න ගත්ත නිසා චරිතාදර්ශ අපිට සමීප උනා. ඒ නිසා ඇතිවුන උත්ප්‍රේරණය මත මම බලාපොරොත්තු උනේ විශ්වවිද්‍යාලක ආචාර්ය මණ්ඩලයකට එකතු වෙන්න.

**විශ්වවිද්‍යාල ආචාර්යවරයෙක් වෙන්න බලාපොරොත්තුවෙන් හිටපු ඔබතුමා අද අධ්‍යාපන පරිපාලන සේවයේ කීර්තිමත් නිලධාරියෙක්. ඒ ගමන් මග ගැනත් අපි කතා කරමු.**

මම උපාධිය සමත් උනාට පස්සේ රැකියාවක් බලාපොරොත්තුවෙන් ඉන්නකොට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේඛන සහකාර තනතුරට අයදුම් කලා. ඒ තනතුර ලැබිලා පළමුවන පත්වීම විදියට මට ලැබුනේ බණ්ඩාරනායක විද්‍යාලයමයි. ඒ 2008 වසරෙදි. එතන සිට 2012 වසර දක්වා මම මෙම පාසලේ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ කටයුතු කලා.

ඒ කාලයේ විදුහල්පතිවරයා විදියට කටයුතු කරපු ලබුතලේ සුදස්සන හාමුදුරුවෝ බොහොම දරදඬු පාලකයෙක්. ඒ යටතේ ලැබුනු ශික්ෂණය ලොකු ආලෝකයක් උනා පසුකාලීනව මගේ වෘත්තීය ජීවිතයට.

ඒ කාලෙ මම පාසලේ පහසුකම් හා සේවා ගාස්තු ගිණුම, පාසල් සංවර්ධන සමිති ගිණුමේ සියලු කටයුතු, ගුණාත්මක යෙදවුම් ගිණුම, ශිෂ්‍ය හැඳුනුම්පත් කියන මේ හැම ක්ෂේත්‍රයක වගේම වරින්වර පවරපු සෑම රාජකාරියක්ම කලා. අද වන විට ඔය රාජකාරි කරන්න 15 දෙනෙක් විතර ඉන්නවා. ඒක හරිම දුෂ්කර සේවා කාලයක්. නමුත් ඒ දුෂ්කරතාව මාර්ගාලෝකයක් උනා පසු කාලීන වෘත්තීය ජීවිතයට.

ඔය කාලයේදි මම ඇත්තටම වැටුපට වැඩියෙන් ගොඩක් මහන්සි වෙලා වැඩකලා. මම ජීවිතයේ විශ්වාස කරන එක මූලධර්මයක් තියෙනවා මේ අතිරික්ත ශ්‍රමය අපිට කවදා හරි දවසක පොලියත් එක්ක හම්බවෙනවා කියලා. ඒකට නිදර්ශන අවස්තා දෙකක් කියන්න පුලුවන්.

මම ලේඛන සහකාර තනතුරේ වැඩකරමින් ඉන්නකොට බස්නාහිර පළාත් ගුරු විභාගය පැවැත්වුනා. ඒ විභාගයෙන් මම බස්නාහිර පළාතෙන් පළමුවෙනියා විදියට සමත්වෙලා මට පළවෙනි පත්වීම ලැබුනේ කෙහෙල් ඇල්ල බෞද්ධ පාථමික විද්‍යාලයට. ඒක ළමයි 8 දෙනෙක් විතර හිටපු පුංචි පාසලක්. මම ඒ ඉස්කෝලෙට පත්වීම අරගෙන ගිහින් මාස දෙකකින් වගේ ඒ පාසලේ හිටපු විදුහල්පතිවරයාගේ වැඩ තහනම් උනා. එවකට පත්වීමට මාස දෙකක් පමණ වෙන ආධුනික ගුරුවරයෙක් උන මට ඒ පාසලේ විදුහල්පතිවරයා ලෙස වැඩ බාරගන්න සිදුඋනා. ඒවා ඇත්තටම ජීවිතයේ අසිරිමත් සිදුවීම්. ඒ පාසල ළමයි 8 දෙනෙක් හිටිය පුංචි පාසලක් උනත් මම එතනදිත් බොහොම මහන්සි වෙලා වැඩකලා. මම විශ්වාස කලා අවාසිදායක සමාජ ආර්ථික පරිසරයක උරුමක්කාරයන් උන ඒ දරුවන්ට අපේ පන්ති යුතුකම ඉටු කළ යුතුයි කියලා.

දෙවෙනි අවස්තාව ගැන කියනවා නම්, ඒ කාලෙ මට අධ්‍යාපන පරිපාලන සේවය ගැන වැඩි උනන්දුවක් තිබුනේ නැහැ. මගේ මිතුරෙක් තමයි ඒ වෙනුවෙන් ඉල්ලුම්පත්‍රය පවා දාලා තිබුනේ. ඒකෙන් පළමුවෙනි විභාග දෙක මම සමත් උනා. දෙවෙනි විභාගයට යනකොට මම සාමාන්‍ය දැනීම මොනවත්ම බලලා තිබුනේ නැහැ. මම එතෙනට ගියහම දැක්කේ අනෙක් ළමයි හැමෝම වගේ ලොකු ලොකු පොත් මිටි ගණන් තියාගෙන පාඩම් කරනවා. මට ඒ වෙලාවෙ කරන්න දෙයක් තිබුනෙ නැති නිසා මම විභාග මධ්‍යස්ථා-නෙ ගේට්ටුව ලඟ ගහලා තිබුන බෝඩ් කියව කියවා හිටියා. එතන එක බෝඩ් එකක තිබුනා ඉස්කෝලෙ ඇතුලේ ජපන් පංචවිධ සංකල්පය ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියලා. මම ඉන්න ගමන් ඒ විස්තර කියෙවුවා. විභාගෙට වාඩිවෙලා ප්‍රශ්න පත්තරේ අතට ගත්තම ඒකෙ තියනවා ප්‍රශ්නයක්, ජපන් පංචවිධ සංකල්පය හඳුන්වා එය පාසලට අදාළ කරගත හැකි ආකාරය හඳුන්වන්න කියලා. ඒක ලකුණු 20 ක තනි ප්‍රශ්නයක්. කෙටිකාලීන මතකය ඇසුරින් මට පුලුවන් උනා ඒ ප්‍රශ්නෙට හොඳ සාර්තක පිළිතුරක් ලියන්න. අර පාඩම් කරපු කිසිම කෙනෙකුට එහෙම අවස්තාවක් ලැබුනේ නැහැ. මම විශ්වාස කරන්නෙ අතිරික්ත ශ්‍රමය නිසා සොබාදහම විසින් අපිව හරියට දිශාගත කරනවා කියලා.

**අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙක් විදියට ඔබතුමාගෙ වෘත්තීය ජීවිතය ආරම්භ කලේ කොහොමද.**

අධ්‍යාපන පරිපාලන සෙවයේ මගේ පළමුවෙනි පත්වීම මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති හැටියට. ඒ 2014 වසරෙදි. 2015 වසරෙදි සේවාස්ථ පුහුණුව අවසන් කරලා මාස දෙකකට පස්සේ, හරියටම 2015 සැප්තැම්බර් 18 වෙනිදා මගේ උපන්දිනය දවසේ මම ඒ විද්‍යාලයේ විදුහල්පතිවරයා වශයෙන් රාජකාරි ආරම්භ කලා. ඇත්තෙන්ම අධ්‍යාපනයේ ඉතාම අවාසිදායක අනතයේ සිට ඉතාම වාසිදායක අන්තය, එහෙම නැතනම් වරප්‍රසාද ලත් අන්තයට මාව තල්ලු කරන්නෙ අතිරික්ත ශ්‍රමය විසින් කියලයි මම විශ්වාස කරන්නෙ. මම එම පාසලේ වසර 9ක් සේවය කලා. ඒ කාලය ඇතුලත මම ඒ පාසල ගොඩනැගුවා. ඒ පාසලේ සංස්කෘතිය ගොඩනැගුවා.

**ඔබතුමාගෙ තමන්ගෙ උරුමයට සවි වෙච්ච තැනක් වෙන, එහෙම නැත්නම් තමන් ශිල්ප ලබාගත්ත මේ විද්‍යාලයට විදුහල්පතිවරයා විදියට පත්වෙලා එනවා. ඒ ගැන විස්තර කලොත්...**

ආදි ශිෂ්‍ය සංගමය ඇතුලු විවිධ පාර්ශවවල ඉල්ලීම පරිදි 2023.07.19 දින මම මේ විද්‍යාලයේ විදුහල්පතිවරයා වශයෙන් වැඩ බාරගත්තා. කොතනදි උනත් මම විශ්වාස කරන්නේ දැනුම හැසිරීමට එකතු විය යුතුයි කියන එක. අපි යමක් දන්නවා නම් අපිට ඒ දේ කරන්න පුලුවන් වෙන්න ඕනි. ඒක තමයි මගේ පදනම් දර්ශනය. ඒවගේම, චර්යාවාදී අධ්‍යාපන ගුරුකුලය තමයි මම විශ්වාස කරන්නෙ මේ මොහොතේ පාසලක් කළමනාකරණය කරන්න පුලුවන් හොඳම ප්‍රවේශය හැටියට. ඒ අනුව දැනුම හැසිරීමෙන් ඔපවත් කරගත්ත දරු පිරිසක් ගොඩනගන එක තමයි මගේ පෞද්ගලික දැක්ම වෙන්නෙ. ඒකෙ මූලාශ්‍රය සීලවීමංශ ජාතකය. ඒ නිසා චර්යාමය සංවර්ධනයක් අධ්‍යාපනයෙන් ඉටු වෙන්න ඕනි.

**පාසල අධ්‍යාපනය පැත්තෙන් ඉදිරියට යන්න ඕනි ආකාරය ගැන ඔබතුමාගෙ සැලසුම් මෙනවද...**

ඉගෙනුමක් කියලා කියන්නෙ අත්දැකීමක් නිසා පුද්ගලයෙකුගේ හැසිරීමේ සිද්ධවෙන දිගු කාලීන හා ස්ථාවර වෙනස. ඒ දේ නොවුනොත් කට පාඩම් අධ්‍යාපනය කියන්නෙ නිස්සාර එකක්. කටපාඩම් කරලා අපි උපයගන්න දැනුම කෙටි කලකින් අවලංගු කර ගත්තොත් අපේ ජීවිත කාලය පුරාම අපි ඒ දේවල් භාවිතයට ගන්නවා. ඒ මත අපේ සාර්ථකත්වය තීරණය වෙනවා.

04 >> පිටුවට

## 03 පිටුවෙන්

ඒ යටතේ විශේෂයෙන්ම දරුවන්ගේ විෂය දැනුම වගේම චින්තන වින්දන පරාසය පුළුල් කිරීම ඉතාම කඩිනම් අවශ්‍යතාවයක් ලෙස මා හඳුනාගෙන තිබෙනවා. අපි ලඟට එන දරුවා කොහොමත් ශාස්ත්‍රීය කාර්යයන්වල නිපුණතාවයක් ඇති දරුවෙක්. මතක තියෙන, ඉගෙනුමට ලැදි, ඉගෙනුම් හුරුවක් තියන දරුවෙක්. ඉතින් අමුතු මහන්සියක් අවශ්‍ය නෑ A 9 ක් ගන්න. A 9 කියන්නෙ සාමාන්‍ය පෙළ කිට්ටු වෙලා දඟලන්න ඕනි දෙයක් නෙමෙයි. A 9 හෝ A 3 හැදෙන්න ඕනි 6 ශ්‍රේණියේ ඉඳලා ස්වාභාවිකව. එතකොට අපි යම් දරුවෙක් විෂය දැනුම ඇතුලෙ අවගමනය වෙනවා නම් ඒ අවගමනය වීමේ අවස්ථාව හඳුනාගෙන අදාළ මොහොතේ මැදිහත්වීම කරන්න ඕනි. ඒ මොහොතේ කරන මැදිහත්වීම සුලු මැදිහත්වීමක්.

මම විශ්වාස කරනවා මේ පාසලේ ඉන්න හැම දරුවෙකුටම A 9 ක් ගන්න පුලුවන් වෙන්න ඕනි. ඒක අමුතු කැපකිරීමක ප්‍රතිඵලයක් නොවෙන්නත් ඕනි. හැබැයි ඒක උනා හෝ නැතා ඒ හැම ළමයෙක්ම 21 වන සියවසේ පුරවැසිභාවය සඳහා උවමනා කරන කුසලතා අත්පත් කරගත් දරුවෙක් වෙන්න ඕනි. එයාට හොඳට සන්නිවේදනය කරන්න, කණ්ඩායමක් එක්ක වැඩකරන්න, සහකම්පනයෙන් යුක්තව ජීවත් වෙන්න පුලුවන් වෙන්න ඕනි. ඒ සමාජ කුසලතා, මානව කුසලතා සහිත පුද්ගලයෙක් ගොඩනගනවා කියන්නෙ ඔහුට දැනුම ඉපයීම සරල ක්‍රියාවලියක් කියන එක. ඒක තමයි අපේ අපේක්ෂාව.

විශේෂයෙන්ම පිරිමි දරුවෝ කියලා කියන්නෙ අනාගත සියනෑ කෝරලයේ එහෙම නැත්නම් ගම්පහ දිස්ත්‍රික්කයේ පිරිමි දරුවෝ, අනාගත පියවරු, ඒ වගේම අනාගත ඡන්ද දායකයො. ඒ නිසා ගම්පහ දිස්ත්‍රික්කයේ අනාගතය තීරණය කරන ප්‍රධාන ගාමක බලවේගය අපි නිෂ්පාදනය කරමින් ඉන්නවා. එතකොට මේ මානව කම්හල සෑම වෙලාවකම නිෂ්පාදන දෝෂ රහිත එකක් වෙන්න ඕනි. සබන් නිෂ්පාදනය කරද්දි වැරදුනොත්, නරක් උනොත් අපිට ඒ ටික විසි කරන්න පුලුවන්. ඒවගේම ටොෆී නිෂ්පාදනය කරද්දි පදම වැරදුනොත් ඒ ටික විසිකරන්න පුලුවන්. නමුත් යම් ශිෂ්‍ය කණ්ඩායමක ආකල්ප වැරදුනොත්, කුසලතා අත්පත්කර නොගත්තොත් අපට ඒ අය මරාදමන්න බැහැ. ඔවුන් සමාජගත වෙනවා. ඉතින් ඒ සමාජ ගතවන කණ්ඩායම වරදවා සමාජගත කරන්න බැහැ අපිට. ඒ නිසා ඔවුන් ගැන හරිම සංවේදී වෙන්න ඕනි.

ඒවගේම මේ තියන ශාස්ත්‍රීය අධ්‍යාපනය ඇතුලෙ දැනුම ප්‍රශ්න කරන, නව දැනුම සොයා යන, දැනුමට දැනුමක් එකතු කරන්න පුලුවන් ප්‍රඥා සම්පන්න මිනිසුන් පිරිසක් තමයි අපි හදන්න ඕනි.

**ඔබතුමාගෙ අදහස පැහැදිලියි. ඒ වෙනුවෙන් ක්‍රියාත්මක කරන්න නියමිත සැලසුම් ගැනත් අපි දැනගන්න කැමතියි.**

ළමයෙක් ප්‍රඥා සම්පන්න කරන්නේ කෙසේද කියන දැවැන්ත ප්‍රශ්නය අපි ඉදිරිපිට තියන වෙලාවක ඒ වෙනුවෙන් දැවැන්ත වැඩපිළිවෙළ රාශියක් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.

එකක් තමයි කියවීමට හුරු දරුවෙක් ගොඩනැගීම. ඒ සඳහා අපි සෑම කාලච්ඡේදයකින්ම මිනිත්තු 2 ගානේ අරන් දැනට පවතින කාලච්ඡේද සංඛ්‍යාව 9 ක් ආගමික වතාවත්වලින් පස්සෙ එන එම අමතර කාලච්ඡේදය අපි කියවීම සඳහා භාවිතා කරනවා. ඒ කාලච්ඡේදය Silent Reading Time එහෙම නැත්නම් නිහඬ කියවීම් කාලය ලෙස නම්කරනවා. මේක අපි භාවිතා කරපු ක්‍රමවේදයක්. මේ භාවිතාව ඇතුලෙ ළමයින්ගේ වාග් කෝෂය පුලුල් වෙනවා. චින්තන වින්දන හැකියාවන් දියුණු වෙනවා. සාමාන්‍ය දැනීම දියුණු වෙනවා. ඒවගේම ළමයාගේ අත්දැකීම් ක්ෂේත්‍රය විශාල වෙනවා. එතකොට ගොඩනැගෙන්නේ හිතන මිනිහෙක්, විඳින මිනිහෙක්. හිතන්න, විඳින්න පුරුදු මිනිසා ප්‍රඥාවට සමීප වෙනවා. එතකොට ඒක තමයි අපේ ක්‍රමවේදය, අපේ බලාපොරොත්තුව.

ඒක ඇතුළෙ තව පුංචි පුංචි වෙනස්කම් ගොඩක් තියෙනවා. කවි ලියන ළමයෙක්, කවි ලියන ඉංජිනේරුවෙක්, නවකතාවක් ලියන්න පුලුවන් වෛද්‍යවරයෙක් ඒවගේම සාහිත්‍ය විචාරයක් කරන්න පුලුවන් සාහිත්‍ය ස්පර්ශ කරන්න පුලුවන් ඒක අනෙකාට තේරුම් කරන්න පුලුවන් CEO කෙනෙක් අපි හදන්න ඕනි.

දෙවනුව අපි මේ පවතින ක්‍රමය තුළම ඉගෙනුම් ඉගැන්නුම් ක්‍රියාවලිය ඇගයීම සඳහා විශේෂ වැඩපිළිවෙළ රාශියක් ආරම්භ කරන්න බලාපොරොත්තු වෙනවා. එතකොට ඒ මත පැහැදිලි ඉලක්ක වෙත පාසල ඉලක්ක ගත කරනවා. ඉතින් ඔය ටික තමයි අධ්‍යාපන සංවර්ධනය ගැන කියන්න තියෙන්නෙ.

**ඒවගෙම විදුහල්පතිතුමනි ක්‍රීඩා හා විෂය සමගාමී කටයුතුවල අනාගත සැලසුම් ගැනත් කතා කලොත්....**

ඉංග්‍රීසි පිරුලක් තියෙනවා අත්දැකීම් තමයි හොඳම ගුරුවරයා කියලා. ඒ නිසා වැඩිවශයෙන් අත්දැකීම් අවකාශය පුලුල් වෙන තරමට ළමයින්ගෙ ජීවන අත්දැකීම් ප්‍රසාරණය වෙනවා. ඒ ඔස්සේ ප්‍රඥා සම්පන්න ළමයෙක් ගොඩනගනවා කියන අපේ දැක්ම යථාර්තයක් බවට පත්කරගත හැකි වෙනවා. ඒ නිසා සාමාන්‍ය පන්තිකාමරගත අධ්‍යාපනය නෙමෙයි අධ්‍යාපනය විදියට සලකන්නෙ. අපි කලින් කිවුවා වගේ අධ්‍යාපනය කියන්නෙ අපේ තියෙන අත්දැකීමකින් අපි අපේ හැසිරීමට එකතු කර ගන්නා දිගුකාලීන ස්ථාවර වෙනස.

ඉතින් විෂය සමගාමී ක්‍රියාකාරකම් තුළින් අපට ඒ වෙනස දරුවාට අත්පත් කර දෙන්න පුලුවන්. චර්යාවේ වෙනස්කම් ඇති කරන්න පුලුවන්. උදාහරණයක් විදියට ශිෂ්‍යභට, බාලදක්ෂ, විවාද වගේ බාහිර කටයුත්තක යෙදෙනකොට ඒ ළමයි අනෙක් සාමාන්‍ය ශිෂ්‍යයෙක් අත්දකින විශ්වයට වඩා ඔහුගේ නිර්ණ සීමාව පුළුල් වෙනවා. ඒ ඔස්සේ ලබන අත්දැකීම් එක්ක ඔවුන් ලොකු අවකාශයක සැරිසරනවා. ඔවුන්ගේ පියාපත් සවිමත්. විශාල දුරක පියාඹන්න පුලුවන්. ඔවු-න් දකින ප්‍රමාණයත් ඒ නිසා වැඩියි. ඒ නිසා එහෙම දරුවෙක් තමයි අපි හදන්න ඕනි.

මේ යටතේ අපි ඉසවු කිහිපයක් හඳුනගෙන තියෙනවා. ශිෂ්‍යභට ව්‍යාපාරය පාසල තුළ සාර්ථකව ක්‍රියාත්මක උන එකක්. ඒ නිසා අපි ඒ ගැන විශේෂ අවධානයක් යොමු කරනවා. හැබැයි හුදෙක් හර්මන් ලූස් හෝ ඒවගේ ජයග්‍රහණ සඳහා පමණක්ම නොවෙයි. ජයග්‍රහණ සඳහා දරුවන්ගේ ජීවිත බිලිදීම වෙනුවට ශාස්ත්‍රීය වශයෙනුත් සාර්ථක වෙන නමුත් එම ජයග්‍රහණ අත්පත් කරගන්න දරුවන් විදියට අපි ඒ ළමයින්ව හදන්න ඕනි. එතනදි විශේෂයෙන්ම ශිෂ්‍යභටයා හැදෙන්න ඕනි ශිෂ්‍යභටභාවය චරිතායනය කරගත්ත කෙනෙක් විදියට.

බිලට් එක විතරක් පිළිවෙළට තියාගෙන ගෙදර කාමරය පිස්සන්කොටුවක් කරගත්ත කෙනෙක් අපිට වැඩක් නැහැ. ඒ වගේම සෑම විෂය සමගාමී ක්‍රියාකාරකම කින්ම ජීවිතයේ හැසිරීමේ යහපත් ධනාත්මක වෙනසක් ඇතිකර ගනිමින් ජයග්‍රහණ ලබා ගැනීම තමයි විෂය සමගාමී කටයුතු සම්බන්ධයෙන් අපේ දැක්ම වෙන්නෙ.

**අපේ පාසල දැනටමත් භෞතික සම්පත් අතින් යම් දියුණු මට්ටමක පවතිනවා. ඉතින් පාසලේ භෞතික සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් ඔබතුමාගෙ අදහස මොකක්ද...**

භෞතික සම්පත් සංවර්ධනය ගැන කතා කලොත් මම විශ්වාස කරනවා පාසලක භෞතික සම්පත් වලටත් සප්‍රාණික බවක් තිබෙනවා කියලා. පාසලේ ගුරුවරු ඉන්නවා, දරුවන් ඉන්නවා, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයක් ඉන්නවා, එතනදි පාසලේ ගොඩනැගිලි ඩෙස් පුටු ආදියත් ඉන්නවා කියලා මම විශ්වාස කරනවා. ඒ කියන්නෙ මේක ක්‍රියාවලියක්. ගුරුවරු උගන්වන, දරුවන් ඉගෙන ගන්න, ගොඩනැගිලි ඩෙස් පුටු ඇතුලු අනෙකුත් සම්පත් ඉගෙනුම් ඉගැන්නුම් ක්‍රියාවලිය සඳහා නිරන්තරයෙන් උපයෝජනය වන තැනක්. ඒ නිසා පාසල කියන්නේ සජීවී ආයතනයක්. සප්‍රාණික ආයතනයක්. අපි ඒකට කියන්නේ සම්පත් සජීවීකරණය කියලා.

සම්පත් සජීවීකරණය වෙන වටපිටාවක් පාසල තුළ ක්‍රියාත්මක වෙන්න ඕනි. ඒ සඳහා පොලිතීන්, ප්ලාස්ටික්, කැලිකසල වලින් තොර ප්‍රසන්න වටපිටාවක් පාසල තුළ තියෙන්න ඕනි. ඒ වටපිටාව තුළ ඉතාම ප්‍රශස්ථ ලෙස පාසල් භූමියත් ගොඩනැගිලිත් ඉගෙනුම් ඉගැන්නුම් ක්‍රියාවලියට උපයෝජනය වන වටපිටාවක් නිර්මාණය කරන්න ඕනි. ඒ තුළින් ඉගෙනුම් ඉගැන්නුම් ක්‍රියාවලිය සාර්ථක වෙනවා. වඩා සෞම්‍ය එකක් බවට පත් වෙනවා.

**ඉතින් විදුහල්පතිතුමනි. මේ සාකච්ඡාවේ අවසානයක් විදියට මේ පාසල සම්බන්ධයෙන් සර්ගෙ අදහස සාරාංශ කලොත්...**

බණ්ඩාරනායක විද්‍යාලය ගත්තහම මේ පාසල විශාල ආධ්‍යාත්මික ජීව ගුණයක් සහිත තැනක්. ඒ වගේම විශාල සංස්කෘතියක්, විශාල සැඟවුනු සංස්කෘතියක් සහිත තැනක්. ඉතින් ඒ නිසාම මේක අභියෝගයක්. සමහර වෙලාවට අපි කැඳවන නව සංකල්ප හෝ නව වැඩසටහන්වල ධරණීය ගුණය පිළිබඳව ප්‍රශ්න ඇති වෙනවා. ඒ පිළිබඳව අපිට දැන්විය යුතු, පැහැදිලි කළ යුතු පාර්ශව විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඉතින් එතකොට කාර්යඵලය කියන කාරණාවේදි අපිට ඒවා බාධා විදියට පවතින්න පුලුවන්. නමුත් අපි දුෂ්කර උනත් ඒ අභියෝගය ජයගන්න ඕනි.

අපිට සමහර වෙලාවට සමහර දේවල් වෙනස් කරන්න බැහැ. නමුත් වෙනස කියන දේ තමයි ජයග්‍රහණයේ ආරම්භය. අපි ධනාත්මකව වෙනස් නොවුනොත්, අපි අනවශ්‍ය තරමට ගතානුගතික උනොත්, සම්ප්‍රදායවාදී උනොත් අපට සංවර්ධනයක් නැහැ. ඒ නිසා දැක්මක් සහිත සංවර්ධන අපේක්ෂාවන් ඇති වෙන්න ඕනි.

**සාකච්ඡා කළේ : තිළිණ ප්‍රියසාද්**

# විධායක ලේකම්තුමාගේ පණිවිඩය......



**වසර කිහිපයක් පැවති නිහැඬියාව බිඳ දමමින්, ආදි ශිෂ්‍ය සංගමයේ නිල පුවත්පත වන සකිසඳ පුවත්පත යළි ආරම්භ වන අවස්ථාවේ දී මෙලෙස පණිවිඩයක් ලබාදීමට හැකිවීම සතුටකි.**

අප විදුහලේම ආදි ශිෂ්‍යයෙකු අද මෙම විද්‍යාලයේ නියමුවාණන් ලෙස බණ්ඩාරනායක විද්‍යාලය ඉතා දීප්තිමත් අනාගතයක් කරා මෙහෙයවන මොහොතක ආදි ශිෂ්‍ය සංගමයේ ගරු විධායක ලේකම් ලෙස නැවත වතාවක් මා තෝරා පත් කර ගෙන එම ගමනට ශක්තියක් වීමට මා හට අවස්ථාව ලබාදීම පිළිබඳව ආදි ශිෂ්‍ය සංගමයේ සියලුම සොයුරන්ට මාගේ ගෞරවණීය ස්තූතිය පුද කරමි.

අප සංගමයට අලුතින් පත් වූ නව නිලධාරී මණ්ඩලය හා විධායක කමිටුවේ සාමාජික සොයුරු සොයුරියන්ට ද මාගේ සුබපැතුම් එක් කරමි. එසේම, ආදි ශිෂ්‍ය සංගමය ඉතා ශක්තිමත් මෙන්ම සහෝදරත්වයෙන් පිරුණු එකමුතුවක් ලෙස ඉදිරියට ද පවත්වා ගෙන යාමට ඔබ සැමගේ දායකත්වය පෙර සේම ලබා දෙනු ඇතැයි මා විශ්වාස කරමි.

අප විද්‍යාලය මේ වන විට අධ්‍යාපනික, ක්‍රීඩා හා විෂය බාහිර ක්‍රියාකාරකම් යන ත්‍රිවිධ අංශයෙන්ම විශිෂ්ටත්වයට පැමිණ ඇත. එහිදී පාසලේ ඉදිරි ගමනට අවශ්‍ය ශක්තිය හැකි සෑම අයුරින්ම ලබා දීම ආදි ශිෂ්‍ය සංගමය ලෙස අපගේ වගකීමයි. අතීතයේදී මෙන්ම වර්ථමානයේදීත් එම සහයෝගය අප විසින් පාසලට උපරිම අයුරින් ලබා දී ඇති අතර එය තවදුරටත් ශක්තිමත්ව ඉදිරියට පවත්වාගෙන යාමට ආදි ශිෂ්‍ය සංගමයක් ලෙස අප තව තවත් ශක්තිමත් විය යුතුය.

එහිදී සංගමයේ සාමාජිකත්වය වර්ධනය කිරීම ප්‍රධාන අවශ්‍යතාවයක් වන අතර හැකි සෑම අවස්ථාවකම නව සාමාජිකයින් අප සංගමයට එකතු කිරීමට දායක වන මෙන් සියලුම සොයුරන්ගෙන් ඉතාම දයාබරව ඉල්ලා සිටිමි.

එළඹෙන 106 වන සංවත්සරය වෙනුවෙන් සුවිශේෂී ක්‍රියාකාරකම් රැසක් ඉදිරියේ දී පැවැත්වීමට අප සංගමය විසින් සැලසුම් කරමින් සිටින අතර එළඹෙන ජූලි මාසයේදී පැවැත්වීමට නියමිත **X Ban 2024** අධ්‍යාපනික ප්‍රදර්ශනය හා සැණකෙලිය ඒ අතරින් ප්‍රධාන වේ. එම කාර්යයන් සාර්ථක කර ගැනීමට වසර කණ්ඩායම් වල දායකත්වය සහ සහභෝගය අප හට ලබා දෙන ලෙසත් හැකි සෑමවිටම මවු සංගමය ලෙස අප සංගමය සමග අත්වැල් බැඳ ගන්නා ලෙසත් ඉල්ලා සිටිමි. එසේම, සකිසඳ පුවත්පත අප සංගමයේ නිල පුවත්පත ලෙස අඛණ්ඩව පවත්වා ගෙන යාම අත්‍යවශ්‍ය කරුණක් වන අතර මෙම කාර්යය සාර්ථක කර ගැනීමට සහයෝගය ලබා දුන් සැමට මාගේ ගෞරවණීය ස්තූතිය පුදකර සිටිමි.

**සචිත්‍ර මිලන් ප්‍රභා**
විධායක ලේකම්

## හෙට ලොව දිනන නායකවරුන්



**ගරුක මනුජය**
ගණිත අංශය
**ගම්පහ දිස්ත්‍රික් ප්‍රථමයා**




**විරාජ් රවිඳු**
ගණිත අංශය
**ගම්පහ දිස්ත්‍රික් දෙවැනියා**



**දසුන් අනුසර**
තාක්ෂණවේදය අංශය
**ගම්පහ දිස්ත්‍රික් ප්‍රථමයා**
**සමස්ත ලංකා තෙවැනියා**



**අනුජය කරුණාතිලක**
ජීව විද්‍යා අංශය
**ගම්පහ දිස්ත්‍රික් දෙවැනියා**



**චමල් කාන්චන**
ජීව විද්‍යා අංශය
**ගම්පහ දිස්ත්‍රික් තෙවැනියා**

06 >> පිටුවට

# ඇසුන පසතුරු නදක විසිතුරු

පසුගිය අප්‍රියෙල් මස 7 වෙනිදා බණ්ඩාරනායක විදු මැණියන්ට සුවිශේෂී දවසක්. අවුරුදු 27 කට පසුව 2023 වසරේ පෙරදිග ශිෂ්‍යභට තූර්යවාදක කණ්ඩයේ අපේ ආදරණීය සොයුරන් සමස්ථ ලංකා ශූරතාවය වන ජයතිලක බණ්ඩාර අභියෝගතා ශූරතාවය බණ්ඩාරනායක විදුහල් මැණියන්ගේ තුරුලට රැගෙන ආ සතුට සමරන්න ආදි ශිෂ්‍යභට තූර්යවාදක සංගමයේ සොයුරන් ඉතාම සොඳුරු ප්‍රසංගයක් සංවිධානය කරලා තිබුනා "ධාරා" නමින්...

අභිමානවත් බණ්ඩාරනායක පුත්‍රයෙක් වගේම පෙරදිග ශිෂ්‍යභට තූර්යවාදක කණ්ඩයේ ආදි සාමාජිකයෙක් වූ වත්මන් ගුවන් හමුදාපතිතුමන්, එයාර් මාෂල් උදේනි රාජපක්ෂ මැතිතුමන් ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ මේ වර්ණවත් සැඳෑව සිය සප්තස්වරයේ නාද රසයෙන් රසගන්වන්නට පෙරදිග ශිෂ්‍යභට තූර්යවාදක කණ්ඩය වගේම අපරදිග ශිෂ්‍යභට තූර්යවාදක කණ්ඩයත් තම දායකත්වය ලබා දුන්නා.

ඒ විතරක් නෙමෙයි හත්වන බලඇණියේ සහෝදරත්වය හා ළබැඳියාව සනිටුහන් කරමින් ගම්පහ රත්නාවලී බාලිකා විද්‍යාලයේ සහ ගම්පහ යශෝධරා දේවී බාලිකා විද්‍යාලයේ පෙරදිග ශිෂ්‍යභට තූර්යවාදක කණ්ඩයනුත් මේ ප්‍රසංගයේ සප්තස්වරයෙන් පෙලහර පෑවා..

ඒවගේම, අනාගතයේ දවසක පෙරදිග ශිෂ්‍යභට තූර්යවාදක කණ්ඩය නියෝජනය කරන්නට බලාපොරොත්තු දල්වාගෙන සිටින විද්‍යාලයේ කණිෂ්ඨ පෙරදිග තූර්යවාදක කණ්ඩායමේ පුංචි මල්ලිලා මේ ප්‍රසංගයේ දී දක්වපු හැකියාව ඉතාම ඉහළින් අගය කරන්නත් ඕනි...

එදා ධාරා වේදිකාව රසවත් කළ විද්‍යාලයේ සංගීත අංශයේ සොයුරන්ගේ ගායන හැකියාව ඉදිරියේ විද්‍යාලයීය නර්ථන අංශයේ සොයුරන්ගේ නර්ථන හැකියාව දෙවෙනි වෙන්න කැමති උනෙත් නෑ... රන් රසේ එක් වන ලෙසේ ඒ සංගීතයට නර්ථනය අපූරුවට පෑහුනා... ඒ අතරට එක්වුනු යශෝධරා දේවි බාලිකාවියන්ගේ කෝමල නර්ථන ලීලාවන් ධාරා ප්‍රසංගයට එකතු කලේ රම්‍ය සුනම්‍ය සුලලිත හැඩයක්...

ධාරා ප්‍රසංගය මේ විදියට නැටුම් ගැයුම් වැයුම් මැද ගලාගෙන යද්දි ගීත ගායනයට වේදිකාවට නැගුනේ දෙරණ ඩ්‍රීම් ස්ටාර් රියැලිටි තරඟාවලියේ කිරුළ හිමිකරගත් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අංජලී හේරත් ගායන ශිල්පිණිය. ඇයගේ මධුර මනෝහර ගායන ලීලාව පෙරදිග ශිෂ්‍යභට තූර්යවාදක කණ්ඩායමේ පංචතූර්ය නාදය සමග අපූරුවට මුසු වෙලා ගලාගෙන ගියේ පාසල් ක්‍රීඩා පිටිය අතුරු සිදුරු නැතිව රැස්ව සිටි නරඹන්නන්ගේ සවන් රසයෙන් සනහාලමින්.

ධාරා ප්‍රසංගය ගැන කතාකරද්දි සියනෑ කෝරලයේ වස්දඬු රාවය ලෙස බුහුමන් ලද විද්‍යාලයීය පෙරදිග ශිෂ්‍යභට තූර්යවාදක කණ්ඩයේ ඉතිහාසය ගැනත් මතක් නොකරම බැහැ. 1987 වර්ෂයේ මුල් වරට සමස්ත ලංකා ශූරතාවය දිනා ගැනීමෙන් අනතුරුව ඇරඹි ඒ ජයග්‍රාහී ගමන් මාවත ඉන් පසුව 1992, 1993, 1994, 1996 හා 2023 යන වර්ෂවලදී නැවත නැවතත් සමස්ත ලංකා කුසලානය විද්‍යාල මාතාවට ලබා දෙමින් මේ වන විට විජයග්‍රාහී ගමනක යෙදෙනවා. ඒ හයවතාවෙදිම ඔවුන් සමස්ත ලංකා ශූරතාවය දිනාගන්නේ හොඳම සංගීතය සඳහා වන ඇගයීම් සම්මානය වන ඩබ්ලිව්. බී. මකුලොලුව සම්මානයද හිමිකර ගනිමින්. ඒක සුවිශේෂී කරුණක්. ඒ කාලය අතරතුර දී පිට පිටම වසර තුනක් එක දිගට සමස්ත ලංකා කුසලානය ඔවුන් දිනාගත්තේ එසේ පිට පිටම තෙවතාවක් සමස්ත ලංකා ජයග්‍රහණයෙන් පිදුම් ලැබූ ප්‍රථම පාසල ලෙස ගෞරවණීයත්වයක් බණ්ඩාරනායකයට ලබා දෙමින්. ඒවගේම 1995, 2000, 2003, 2005 සහ 2012 වසරවලදී අපේ පෙරදිග ශිෂ්‍යභට තූර්යවාදක කණ්ඩය විසින් සමස්ත ලංකා අනුශූරතාවය දිනා ගැනීමත් අමතක කරන්න බැහැ.

ධාරා ප්‍රසංගය මේ විදියට සංවිධානය වෙන්නේ පාසල් ශිෂ්‍යභට තූර්යවාදක කණ්ඩායමක් විසින් දැවැන්ත එළිමහන් ප්‍රසංගයක් පැවැත්වූ පළමු අවස්ථාව විදියට.

ධාරා ප්‍රසංගය සඳහා ප්‍රධාන අමුත්තා විදියට සහභාගී වූ ගුවන් හමුදාපතිතුමන්ටත් ප්‍රසංගය සංවිධානය සඳහා දායකත්වය සැපයූ ආදි පෙරදිග ශිෂ්‍යභට තූර්යවාදක සංගමයටත්, විදුහල්පතිතුමා ඇතුලු ආදි ශිෂ්‍ය සංගමයටත් පෙරදිග හා අපරදිග ශිෂ්‍යභට කණ්ඩයන්වල සියලුම සාමාජිකයින්ටත් තමන්ගේ ගෞරවණීය ස්තූතිය පුදකරන බව ආදි පෙරදිග ශිෂ්‍යභට තූර්යවාදක සංගමයේ උප සභාපති අකලංක ශ්‍රී දයාරත්න මහතා සකිසඳට ප්‍රකාශ කර සිටියා.

ඒ වගේම ප්‍රසංගය වෙනුවෙන් කිසිඳු මුදල් අයකිරීමකින් තොරව ගීත ගායනයට එක්වූ අංජලී හේරත් ගායන ශිල්පිණියටත් රත්නාවලී බාලිකා විද්‍යාලයේ සහ යශෝධරා දේවි බාලිකා විද්‍යාලයේ පෙරදිග තූර්යවාදක කණ්ඩවල සියලුම සාමාජිකාවන්ටත්, එම බණ්ඩභාර ආචාර්යවරුන්ටත්, එම පාසල් දෙකෙහි විදුහල්පතිතුමියන් දෙපලටත්, නර්ථන අංශයේ සියලුම බාලිකාවන්ටත්, එම ගුරු මහත්ම මහත්මීන්ටත් විද්‍යාලයීය සංගීත අංශයේ සහ නර්ථන අංශයේ ගුරු මහත්ම මහත්මීන්ට සහ එම දරුවන්ටත් තමන්ගේ ස්තූතිය ඉතාම හර්දයාංගමව පිරිනමන බව එතුමා වැඩිදුරටත් අප සමග ප්‍රකාශ කලා.

ඉදිරි අනාගතයේදී තව තවත් ජයග්‍රහණ සමගින් ඉදිරියට යන්නට අපගේ පෙරදිග හා අපරදිග ශිෂ්‍යභට තූර්යවාදක බණ්ඩයන්ට අපගේ සුබපැතුම් පිරිනමන ගමන්ම තවත් මෙවන් සොඳුරු ප්‍රසංගයක් නුදුරු අනාගතයේදී සංවිධානය කරන්නට අවශ්‍ය ශක්තිය ලැබේවායි යන්න අපගේ ප්‍රාර්ථනයයි.

**සටහන : තිලිණ ප්‍රියසාද්**

05 පිටුවෙන්



**2023 අ.පො.ස උසස් පෙළ විභාගයේ ගණිත අංශයෙන් පළමුවෙනියා වෙමින් සුවිශේෂී ජයග්‍රහණයක් ලබාගත් ගරුක මනුජය ගමනායක සොයුරා සකිසඳට පැවසුවේ මෙවැනි අදහසක්.**

මගේ ගම රාගම. මට සහෝදරයන් තිදෙනෙක් සහ එක් සහෝදරියක් ඉන්නවා. මගේ තාත්තා විශ්‍රාමික බන්ධනාගාර නිලධාරියෙක්. අම්මා ගෘහණියක්. මම ප්‍රාථමික අධ්‍යාපනය ලැබුවේ රාගම හීන්කෙන්ද ප්‍රාථමික විද්‍යාලයෙන්. මම මුල ඉඳලම හොඳට පාඩම් වැඩ කලා. පාසලේ ගුරුවරුනුත් මුල ඉඳන්ම හිතන් හිටියා මම හොඳ ප්‍රථිපලයක් ගනියි කියලා. මගේ පන්තිභාර ගුරුතුමිය විදියට කටයුතු කළ ඉරේෂා එදිරිසිංහ මැඩම් මට ගොඩක් උදවු කලා. ඒවගේම අපිට සංයුක්ත ගණිතය ඉගැන්වූ තුසිත සර්, භෞතික විද්‍යාව ඉගැන්වූ කුමුදු සර් ඇතුළු ගුරුවරු හැමෝම මම ගෞරවයෙන් මතක් කරනවා. අම්මා තාත්තා ඇතුලු පවුලේ හැමෝම මට ගොඩක් උදවු කලා මේ ප්‍රතිඵලය ලබා ගන්න.

මම කලින් හිතන් හිටියේ ජීව විද්‍යාව හදාරන්න. නමුත් ලොකු අයියා නිසා තමයි මම ගණිත විෂය ධාරාව තෝරා ගත්තේ. ලොකු අයියා තමයි මට මුලින්ම සංයුක්ත ගණිතය ඉගැන්නුවෙත්.

මගේ බලාපොරොත්තුව මොරටුව විශ්ව විද්‍යාලයට ඇතුළත් වෙලා ඉංජිනේරු පීඨයට ඇතුළත් වෙන්න. ඒවගේම පළමු පන්තියේ සාමාර්ථයක් සහිතව උපාධිය සමත් වෙලා මාස්ටර් එකක් නොකර කෙලින්ම PHD එකක් කරන්නත් මගේ ලොකු බලාපොරොත්තුවක් තියෙනවා. ඇත්තෙන්ම මට ඕනි අලුත් දෙයක් කරන්න.

---

**2023 අපොස උසස් පෙළ විභාගයෙන් ඉංජිනේරු තාක්ෂණ විෂය ධාරාවෙන් දිවයිනෙන්ම තෙවන ස්ථානය සහ ගම්පහ දිස්ත්‍රික් ප්‍රථම ස්ථානය දිනාගැනීමට දසුන් අනුසර ජයවීර සොයුරා සමත්ව ඇත. තමා ලබාගත් ජයග්‍රහණය පිළිබඳව ඔහු සකිසඳට මෙසේ පැවසීය.**

මගේ පදිංචිය අඹේපුස්සේ තලගම. මගේ අප්පච්චි විශ්‍රාමික ගුවන් හමුදා නිලධාරියෙක්. අම්මා ගෘහණියක්. මගේ අක්කා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ඉගෙනුම ලබනවා. මම පාථමික අධ්‍යාපනය ලැබුවේ ගමේ පාසලෙන්. කීනදෙණිය ප්‍රාථමික විද්‍යාලය. කපුවැල්ල මැඩම් තමයි මගේ පළමුවෙනි ගුරුතුමිය උනේ. මම 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සමත්වෙලා ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයට ඇතුළත් උනා. ඉගෙනීමට අමතරව මම පාසල් රතු කුරුස සමාජයේ සාමාජිකයෙක් විදියට වැඩකලා. සාමාන්‍ය පෙළ විභාගයට A 9 ක් අරන් උසස් පෙළ සඳහා ඉංජිනේරු තාක්ෂණ විෂය තෝරා ගත්තා. අපේ ඉස්කෝලේ කලින් හිටිය විදුහල්පතිතුමා, ඉරාන් චම්පික සර්

12 >> පිටුවට



# රසෝත්ස' 24

විද්‍යාලයීය කලා සංගමය සහ කලා අංශය එක්ව සංවිධානය කරන ලද වාර්ෂික කලා උළෙල ''රසෝත්ස' 24" නමින් 2024.04.30 වන දින විද්‍යාලයේ ප්‍රධාන ශාලාවේදී අති උත්කර්ෂවත් අයුරින් පවත්වනු ලැබීය. ''පොතපතින් බිහි වූ දෘෂ්‍ය කලාව"යන තේමාව යටතේ මෙවර පැවති කලා උළෙලේ ප්‍රධාන ආරාධිත අමුත්තා වූයේ ප්‍රවීණ කිව්වර රත්න ශ්‍රී විජේසිංහ මහතායි.

මෙම කලා උළෙලට සමගාමීව සාහිත්‍ය තරඟාවලියක්ද පැවැති අතර එයට සහභාගි වූ දිවයිනේ ප්‍රමුඛතම පාසල් 50 ක් අතරින් මහනුවර ත්‍රිත්ව විද්‍යාලයේ කණ්ඩායම පළමු ස්ථානය ජයග්‍රහණය කර ''ආර්.එම්. සුමතිපාල රත්නායක අනුස්මරණ ශූරතාවය" දිනාගන්නා ලදී.

මෙම උළෙල සාර්ථක කර ගැනීමට සහයෝගය ලබාදුන් කලා අංශ භාර ආචාර්ය ආර්.එම්. රූපසිංහ රත්නායක ගුරුපියාණන්ටත් කල්හාරි මල්ලවාරච්චි ගුරුමෑණියන් හා සංජය නිශ්ශංක ගුරුපියාණන් ඇතුළු සමස්ථ ආචාර්ය මණ්ඩලයටත්, කලා සංගමයේ සහ කලා අංශයේ සියලුම සොහොයුරන්ටත්, ආදි ශිෂ්‍ය සංගමයටත් තම ස්තූතිය පුද කරන බව කලා සංගමයේ සභාපති එච්.ඒ සඳුප රශ්මික සොයුරා සකිසඳට පැවසීය.




*Ready to elevate your organization to new heights?*
*Whether you're small, medium, or large-scale,*
*we empower your journey towards excellence.*

**Unlock Your** Organization's Potential with
Certification & Inspection Services!

## Consulting Expertise in:

**Management Systems:**
QMS/EMS/FSMS/OHSMS Product

**Certifications:**
GOLS/GOTS/FSC/OEKO Tex 100
Organic/Agricultural

**Certifications:**
USDA NOP/EU/JAS/GAP/
SL Organic/RegionAgri

**Sustainability Systems:**
Rainforest Alliance,
Carbon Footprint, Water Footprint

**Health & Safety Systems:**
ISO 45001:2018



## Services We Offer:

- Implement New Quality Systems
- Maintain Internal Systems
- Develop Existing Systems
- Internal Audits for System Effectiveness
- Training & Awareness Programs

*Ready for a transformative journey?*
*Contact us for a consultation today!*

**For More Details, Reach Out To:**

**Kosala Dissanayake (2003 Batch)** 071 975 5630
**Lankanath Chathuranga (2001 Batch)** 076 434 9240

"මම ගියා අවුකන බුදුන්ටත් දැස් දුන් මිනිසා සොයා... ඒ සුනිල් එදිරිසිංහයන්ගේ ජනප්‍රිය ගීත බන්ඩයක පද පෙලක්.එම ගීතයෙන් අපි ප්‍රවේශයක් කර ගනිමු. ආරම්භයක් කර ගනිමු. අපේ කථාවට.

**මම දැන් සුදානම්ව සිටින්නේ ගම්පහ ප්‍රදේශයේ ඉපිද බණ්ඩාරනායක විදු මවගේ පහස ලබමින්, සිප්සතර හදාරා ශ්‍රී ලංකික ප්‍රජාවගේ දැස පාදන ගම්පහ නගරයට ආලෝකයක් බඳු කීර්තිමත් බ ණ්ඩාරනායක විදු මවගේ සුජාත පුත්‍රයකු වන ජේ.ඒ විමලසූරිය ඔප්ටිෂියන්ස් සහ "පැනෝරා"අක්ෂි රෝහලේ අධිපති ජේ. ඒ ලසන්ත දීපාල් නම්වූ සොඳුරු මිනිසා අභියස දොඩමළු වන්නටයි.**

**☑ ලසන්ත මල්ලි.... ඔබ දෘෂ්ඨිවිද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රවීණත්වය ලබමින් නවමු පෙරලියක් සිදු කරමින් ශ්‍රී ලාංකේය සන්නාමය දිනා ගත් සාර්ථක වුත් දැවන්ත ව්‍යවසාකයයෙක් කිව්වොත්.... මා නිවැරදියි නේද?**

ඇත්තටම එය නිවැරදියි. හරි ආඩම්බරයෙන් තමයි, මම " ඔව් "කියල කියන්නේ අයියේ...

**☑ ඔබ මේ ක්ෂේත්‍රයට පිවිසුනේ කෙසේ ද? ඔබ ආ මග ගැන ආපසු හැරී, සැකෙවින් පැහැදිලි කිරීමක් කලොත් ?...**

මම මේ ව්‍යාපාරය පටන් ගත්තේ 1994 වසරේ දී. මේ ක්ෂේත්‍රයේ මගේ සාර්ථකත්වය ගැන කතා කරනවානම් ඇත්තෙන්ම මේකට බණ්ඩාරනායත පුත්‍රයකුත් සම්බන්ධයි. මම ඒක අභිමානයෙන් කියන්න ඕනැ. මොකද ගම්පහ ඔප්ටිකල් ආයතනයෙන් තමයි මම ඉස්සෙල්ලම "අ" ඉගෙන ගත්තේ. ඒ ආයතනයේ අධිපතිතුමාගේ පුතා, නන්දන ආරියරත්න මගේ පාසල් මිතුරා. මම අදටත් එම ආයතනයට නිහතමානීව ගෞරව කරනවා. මේ තත්ත්වය මට උදා කරල දුන්නේ ඒ ආයතනය කිව්වොත් මා නිවැරදියි. මම එයාලා ලඟ වසර ගණනාවක් සේවය කලා. පස්සේ මට හිතුනා මගේ දැනුමින් ගම්පහට වෙනස් යමක් කරන්න ඕනි කියන චේතනාවෙන් තමයි මේ සේවාව පටන් ගත්තේ.

**☑ ජේ. ඒ. ලසන්ත දීපාල් නම් වු ඔබ.. " ජේ. ඒ. විමලසූරිය " පැනෝරා " ආදී නම් වලින් ආයතන බිහිකරනවා... ඒ නම් හා ඔබේ ඇති සබැඳියාව.**

විමලසූරිය කියන්නේ මගේ දයාබර බිරිඳගේ වාසගම. එයත් මේකට මුල සිටම සම්බන්ධයිනේ. ජේ.ඒ. විමලසූරිය කියන්නේ අපි දෙන්නගෙම වාසගම්වල සංකලනක්."පැනෝරා මා "කියන්නේ ලොකු පරාසයක් කියන එකයි. පෙනීම කියන එකට සීමාවක් නැහැ. ඒ නිසා තමයි "පැනෝරා" නම දැම්මේ.

**☑ ඔබගේ දෘෂ්ඨි පරීක්ෂණ ආයතනය දෘෂ්ඨි පරීක්ෂාවට එහා ගිය දුර්ලභ වූ අක්ෂි ආබාධයන් හඳුනාගත හැකි තරමේ සුවිශේෂ වූ දක්ෂතා ඇති කාර්යය මණ්ඩලයක් සිටිනවා. ඒ ගැන යමක් පැවසිය හැකිද ?**

අපේ කාර්යය මණ්ඩලයේ මේ වෙන කොට 80 කට ආසන්න පිරිසක් ඉන්නවා. ඒ අය ඔක්කොම සුවිශේෂී පුහුණුවක්ලත් අය. අපි නිතරම අළුත් වෙනවා. ලෝකය අළුත් වෙන කොට අපිත් අළුත් වෙන්න ඕනි. මේක අළුත් වෙන්නේ නැතුව දියුණුවක් කරා එළඹිය නොහැකි ක්ෂේත්‍රයක්. ව්‍යාපාර සඳහා මම ලෝකය පුරා යන මනුස්සයෙක්, එතනදී ලෝකයේ මේ තාක්ෂණය, මේ විෂය තියෙන්නේ කොතනද, ලංකාවේ තියෙන්නේ කොතනද කියන එක මට දැනෙනවා. ඒ නිසා මම නිතරම උත්සහ කරනවා ලෝකයේ එම නවීනතම තාක්ෂණය තියෙන තැනට, ලංකාව ඔසවා තබන්න. ඒකම තමයි මගේ තිබෙන දැවැන්තම පිපාසය. ඒ සඳහා දැරූ ප්‍රයත්නයක ප්‍රතිඵලයක් හැටියට තමයි, ඉහල තාක්ෂනයෙන් උසස් "පැනෝරා" අක්ෂි රෝහලත් හා මනාව පරිපූර්ණ වූ නවීන උපකරණයන් ගෙන් සමන්විත ඇස් කන්නාඩි ආයතනයත් බිහිකරන්න හේතුව. මොකද මම ලෝකය දකින නිසා මේ ලෝකයේ මිනිස්සු මීට වැඩිය උසස් දේවල් පාවිච්චි කරනවා. ඉතින් මටත් උවමනා උනා ගම්පහ නගරයේ ජීවත්වන මිනිසුන්ටත් මේ පහසුකම් මේ සම්පත් පරිශීලනය කරන්න අවස්ථාවක් ලබාදෙන්න.

**☑ මනුෂ්‍යයකුගේ දෙඇස් පිළිබඳ උනන්දු නොවුනහොත් අන්ධ භාවයට පවා පත් වන්නට පුළුවන්. ඔබ ඒ පිළිබඳව සිදු කරන සත්කාර්යය පැහැදිලි කලොත්?**

අනිවාර්යයෙන්ම ඒක සත්‍යයක්. ඒ පරමාර්ථයෙන්ම පටන්ගත්ත අපේ අළුත්ම සේවාවට දින කිහිපයයි තවම ගත වෙලා තියෙන්නේ. එය S.S.A පරික්ෂණයයි. එය ගම්පහින් අපි තමයි ඉස්සෙල්ලම පටන් ගත්තේ. මම ඒ ගැන නිහතමානීව ආඩම්බර වෙනවා. ඇසට වර්ණකයක් ඇතුල් කර එමඟින් ලබා ගන්න ඡායාරූප සමුහයක් තුළින් සිදු කෙරෙන සුක්ෂම හා තීක්ෂණ වු සංකීර්ණ පරීක්ෂාවක් ඒක. මේ වගේ පරීක්ෂණ දැනට කොළඹදී පමණයි සිදු කෙරෙන්නේ. දිනයක් ගන්න පවා හරිම අපහසුයි. ඉතා මිල අධිකයි. දවසක්වත් ප්‍රමාද වුනොත් අන්ධ භාවයට පවා පත්වෙන්න පුළුවන්. ලංකාවේ සුපතල විශේෂඥ වෛද්‍ය මණ්-ඩලයක් මඟින් " පැනෝරා " රෝහලේදී, දැන් එම කටයුතු සාර්ථකව අප සිදු කරනවා. එතනින් එහා ගිය සියලු පහසුකම් සහිත ගිලන් රථ සේවාවක් අප සතුව තියනවා. සමහරු කියනවා මේ තොරතුරු එළියට දෙන්නැත්තේ ඇයි කියලා. හිතන්නේ මේ තොරතුරු එළියට දන්න ඕනැ සේවා දායකයෝ මිසක් අපි නෙවේ. කොටින්ම කිව්වොත් අපේ ගණුදෙනුකාර භවතුන් තමයි අපේ උන්නතිය වෙනුවෙන් කටයුතු කරන්නේ. ඒක මගේ ව්‍යාපාර දැක්මක්.... ඒවවරයි. අපට තියෙන්නේ ඔවුන් වෙනුවෙන් වැඩ කරන්න පමණයි.



**☑ දෘෂ්ඨි අභාධයන්ගෙන් යම් කරමකට මිදෙන්නට හෝ අවම කර ගන්නට ක්ෂේත්‍රයේ අත්දැකීම බහුල විද්වතෙක් විදියට පොදු සමස්ථ මානව සම්පතටම ඔබ ලබා දෙන පණිවිඩය......**

මනා දෘෂ්ඨි පරීක්ෂාවක් තමයි මේකට එකම පිලියම. අපි සතුව සිටිනවා ප්‍රවීණ දෘෂ්ඨි පරීක්ෂක මඩුල්ලක්. ඔය හැමදේකටම අපි ගාව විසඳුම් තියෙනවා. ඒ තමයි මට තියෙන එකම හයිය. වෛද්‍යවරයෙකුට යොමු කරන්න පෙර දෘෂ්ඨි ආබාධ අප ආයතනයේ දෘෂ්ඨි පරීක්ෂකවරුන් හඳුනා ගන්නවා. සුවිශේෂී ආබාධ ඇති අයව, වෛද්‍යවරු විසින් ඒ අයගේ

**මම නිතරම උත්සහ කරනවා ලෝකයේ එම නවීනතම තාක්ෂණය තියෙන තැනට, ලංකාව ඔසවා තබන්න. ඒකම තමයි මගේ තිබෙන දැවැන්තම පිපාසය**

කාලීන ප්‍රශ්ණ ආබාධ නිවැරදිව හදුනාගෙන සිදු කරන ප්‍රතිකාර මඟින්, ඔවුන් චිරාත්කාලයක් පුරාවට මෙලොව එලිය දකිනවා. ඒකට තමයි මම දහදිය හෙලන්නේ. ඇත්තටම සාමාන්‍යයෙන් අවුරුදු 5න් ළමයකු පාසලට භාර දෙනකොටම පළමු දෘෂ්ඨි පරීක්ෂණය කරන්න ඕනැ. ඒකයි ලෝක සම්මතය. ලංකාවේ මේක හරි අඩුයි. මම මේ වෙන කොට පෙර පාසල්වලට ගිහිල්ලා ස්වේච්ඡාවෙන්ම අක්ෂි සායන පවත්වමින් දරුවන්ගේ අක්ෂි ආබාධ හඳුනාගෙන දෙමව්පියන් දැනුවත්කර අවශ්‍ය විසඳුම් ලබා දෙනවා. මෙය මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු විසින් කල යුතු කාර්යයක්. ඒත් අයහපත් ජීවන රටාවත්, දැනට තියෙන සෞඛ්‍ය ප්‍රශ්ණත්, ආහාර ප්‍රශ්ණත්, හමුවේ අවුරුදු 40න් පසුව සෑම වැඩිහිටි අයෙක්ම, වසර 2න් 2කට මනා දෘෂ්ඨි පරීක්ෂාවන් කර ගැනීමෙන් ඇසේ සුද, "ග්ලූකෝමා" වැනි දෘෂ්ඨිවිතාන ආබාධ සහ ඇස අභ්‍යන්තරයේ වන අනෙකුත් දෝෂයන් කල්තියා හඳුනා ගත හැකි වනවා. එසේ නොවුනොත් ඇසේ අභ්‍යන්තරයේ තිබෙන ආබාධයක් අවසානය තෙක් තමන්ට දැනෙන්නේ නැහැ. ඇත්තටම ඇසේ සුද ඒමත් වළක්වන්න පුළුවන්, බෙහෙත් තියෙන්නේ තමන්ගේම ක්‍රමවත් ආහාර රටාවේ. එතකොට ඔපරේෂන් කරන්න ඕනෙ නැහැ.



**☑ අද කුඩා දරුවන් පවා උපැස් පලඳිනවා. අනාගතයේ හෙට දවස දකින්නට, අපගේ දෑස් නිරෝගිමක් විය යුතුමයි. මෙය ඔබ දකින්නේ කෙසේද? මේ වෙනුවෙන් අපි කුමක් කල යුතුද?**

පෘථිවියේ ඕසෝන් ස්ථරය විනාශ වීම නිසා "අල්ට්‍රා වයලට්" කිරණ ඇස් වලට නිරාවරණය වෙනවා. UV කිරණ ඇසේ කාචයේ පාරදෘශ්‍ය භාවය අඩු කරනවා. මේ අවදානම පිළිබඳව රජයේ මාධ්‍ය වලින් නිතර අවධානයට ලක් වුවත් විසඳුමක් නෑ. මේකට එකම විසඳුම ප්‍රමිතියෙන් යුතු ආරක්ෂිත අව්කන්නාඩියක් (sunglass) පැලඳීමයි. අපේ සංස්කෘතියට අනුව මේක අමුතු දෙයක් වුනාට, විදේශිකයන්ට නම් මේක අත්‍යවශ්‍යම පලඳනාවක්. ජීවිතේ උපකරණයක්.

**☑ ජේ. ඒ විමලසූරිය ඔටීෂියන්ස් ආයතනය සහ පැනෝරා අක්ෂි රෝහල සේවාලාභීන්ට ලබා දෙන දියුණුම තාක්ෂණය, පහසුකම් පිළිබඳව ඔවුන්ගෙන් ලැබෙන ප්‍රතිචාරය කොහොමද?**

බොහෝ සේවා ලාභීන්ගෙන් අප ආයතනයේ කාර්යය මණ්ඩලයටත්, පෞද්ගලිකව මා හටත් ඉතාම ඉහළ ප්‍රතිචාර ලැබෙනවා. ඇත්තටම එය අපට මහත් ධෛර්යයක් විශේෂයෙන්ම මුහුණු පොතේ සහ Instagram වල විවිධ වූ අගය කිරීම් හොඳ ප්‍රතිචාර මට ලැබෙනවා. ඒත් මම කැමතියි එයාලා හදවතටම කතා කරනවා නම්, අපේ රෝහලට ගිය කෙනෙක් කවදාවත් අසතුටෙන් ගිහිල්ලා නෑ. මම දන්නේ නෑ. අපේ ආයතනයට මොන තරා තිරමේ ජනතාවක් එනවද කියලා. ඒ අය අපේ සේවාව පහසුකම ලබා ගෙන අපේ තියෙන උපකරණ වලින් ඇස් පරීක්ෂා කර ගෙන සමහර වෙලාවට අපෙන් වීඩියෝ අරගෙන අපට "කමෙන්ට්ස්" දාන අවස්ථා උපරිමයි. මම ඒකට ගරු කරනවා. එයාලා ඒ සඳහා වෙනම සමාජ මාධ්‍ය ජාලා සමූහයන් හදාගෙනත් ඉන්නවා. මම සමහර වෙලාවට දන්නෙත් නෑ. මගේ යාළුවෝ හම්බ වුනාම කියනවා "මචං උඹ මේ විදියට අලුත් මෙෂින් එකක් ගෙනත් තියනවා නේද" කියලා. මම මේ දේවල් කරනවා කියලා මගේ ගනුදෙනු කරුවෝ ඒවා එළියට දානවා කියන්නේ, මම යම් කිසි දෙයක් කරනවා කියන එකයි, මගේ හැඟීම.




**☑ ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙක් හැටියට ඔබට විශාල ශක්තියක් හැකියාවක් තියෙනවා. මේ සේවාව ශාඛා ඇති කරමින් තවදුරටත් පුළුල් කරන්න?**

මගේ ජීවිතයටවත්, ගම්පහෙන් එහාට ශාඛා බිහිවීමක් සිදුවන්නේ නැහැ. ඒකට හේතුව නම් ගම්පහ නගරයෙන් ඉපැයූ දෙයින් ගම්පහ ජනතාවටම සේවයක් කිරීමයි. ඒ නිසා ඒ වියදම් කරන මුදල් වලින් ගම්පහ ජනතාව ප්‍රයෝජනයක් ගන්නවනම් මම ඒකට ආසයි. සාර්ථක ව්‍යවසායකයෙක් හැටියට ඈත ගම්වල ජනතාව ගම්පහට ගෙන්වාගෙන, එයාලගේ අක්ෂි ආබාධ තුරන් කරන්න, සුවපත් කරන එකයි මගේ ඒකායන අදිටන. ඒ ක්‍රමය තමයි මම හොයන්නේ. මම හොඳ නම් මිනිස්සු මාව සොයා ගෙන ඒවී. මගේ අරමුණ, සංකල්පය, අනන්‍යතාවය, එතනයි තියෙන්නේ.

**☑ ඔබ බන්ඩාරනායක විදු මවට අභිමානයක් ලබා දෙන දීප්තිමත් ආදී බණ්ඩාරනායක වරයෙක්, බෝහෝ සමාජ සත්කාරයන් සිදු කර ඇති ඔබ අනාගත නායකවරුන්ට සමාජයට ලබා දෙන විශේෂ පණිවිඩය කුමක්ද?**

ඕක ව්‍යාපාර පැත්තෙන් දකින්නේ නායකත්වය කියන්නේ ඇත්තටම පුරෝගාමියෙක් කිව්වොත් නිවැරදියි. නායකයා පසුපස අනුගාමිකයන් ඉන්නවා. නැත්නම් නායකත්වයක් තියෙන්න බැහැ. මගේ කාර්ය මණ්ඩලය මගේ නායකත්වය පසු පස නිරතුරුවම සිටිනවා. මම රාජකාරී සිදු කරන බහුතරයකට වගකීම් හා බලතල දීලයි තියෙන්නේ. ඒ මං වගේ තවත් මිනිසුන් බිහිකරලීමටයි. නිතරම පුරෝගාමියකු පසුපස අනුගාමිකයෝ ඉන්නෙ නැත්නම් පුරෝගාමියකයකු වෙන්න බැහැ. මම කව්ද කියලා කියනවනම්. පුරෝගාමිකයකු, හැටියට ව්‍යවාසායකයකු දකින වානම් ඒ දකින තත්ත්වය මම දිගටම පවත්වා ගන්න ඕනි. එක දිහා බලාගෙන තමයි අනුගාමිකයෝ මගේ පසුපස එන්නේ. ව්‍යාපාරිකයකු ස්වාභාවයෙන් කතා කරනවනම්... ව්‍යාපාරික මිතුරන්ට කියන්නේ කම්මැලි වෙන්න එපා. ව්‍යාපාරයක් තුල ඇත්ත අලෙවි කරන්න ඕනී. අමාරුයි තමා, ඒත් ඒ තුලින් තම ස්ථාවරය ගොඩනැගෙනවා. ඒකයි සැබෑ සාර්ථකත්වය. සෑමවිටම ඇත්ත තමයි එළියට දාන්න ඕනී. බොරුව සදාකාලිවම තුරන්විය යුතුයි. මිනිසුන් එතකොටයි අපවටා රොද බැඳ ගන්නේ, එක් රොක් වන්නේ. සමාජ සත්කාරයන් නම් එමටයි. මම කල දේ ගැන කියන්න අකමැතියි. ඒක මගේ හැටි. මගේ හදවත දකිනවා මම මොනවද කරල තියෙන්නේ කියලා සහ මාගේ සේවා දායකයෝ මාව අගය කරනවා. ජනතාව මාගේ ආයතනයට පැමිණීම තමයි මට ලබා දෙන එකම සම්මානය.


**☑ ඔබගේ පාසල් කාලය පිළිබඳව, එහි වූ සොඳුරු හා කටුක වූ, අත්දැකීම සමුදායක් ඇති. ඒ ගැන යමක් පැහැදිලි කලොත්.**

කටුක අත්දැකීම් කියන්නේ, දෙමව්පියොත් එක්ක ගත කරපු කාලයත් එක්ක බලනකොට, පාසල් කාලය බොහෝම කටුකයි. අපේ පවුලේ පස් දෙනෙක් සිටිනවා. මගේ ගම වතුරුගම. ප්‍රථමයෙන් පාසල් ගියේ වතුරුගම ගමේ ඉස්කෝලෙට. පස්සේ බණ්ඩාරවත්ත පරාක්‍රම විද්‍යාලයටත්, පසුව බණ්ඩාරනායක විදුහලටත් පිවිසෙන්න භාග්‍යවන්තයකු වුනා.



**ජේ.ඒ ලසන්ත දීපාල් මහතා**
**(සභාපති සහ කළමණාකාර අධ්‍යක්ෂ)**

අදටත් මම ගිය සෑම පාසලකටම මම ගරු කරනවා. අපට පන්නරය දුන් ගුරුවරුන්ටත් එම පාසල් වලටත් මම ගෞරව කරනවා. මගේ අන්තිම කාලයේ බණ්ඩාරනායකයේ ඉගෙන ගත්තා කියන්නේ මට මහත් අභිමානයක්. සුන්දර අත්දැකීමුත් තියෙනවා. ඇත්තටම මම ව්‍යාපාරිකයෙක් විදියට නෙවෙයි ජීවිතය ගෙනියන්නේ. මොන තරම් මුදල් ඉපයුවත් මගේ සිතුම් පැතුම් තාමත් ඉස්කෝලේ යන ළමයෙක් වගේ, මම තාමත් ඇත්තටම ළදරුවෙක්.







12 >> පිටුවට


හොඳම භාණ්ඩ අඩුම මිලට අපෙන්.....
ධම්මික සුපර්
ඉහළගම
077 700 3480
SHOP NOW


කාලය ඉතුරු කරන, පහසුව සලසන
ගෙදරටම එන
සුපිරි වෙළෙඳසැල
SMART
PICK PACK
DELIVERING YOUR CHOICE
පික් පැක්
සිතැඟි දේ ඔබ වෙතට
Smart Pick Pack Private Limited
No. 237, Kandy Road, Kiribathgoda.
www.smartpickpack.lk
facebook.com/SmartPickPack
070 470 7000
011 342 7500


ධාරා

# ගුරු සිත





කුමාරි විජේසූරිය ගුරු මෑණියන්

**"ආයුබෝවන් කුමාරි මිස්, අපි ඉඳලා හිටලා හරි මුණ ගැහෙන නිසා සැප සනීප කොහොමද කියලා මං අහන්නෙ නෑ. මං කුමාරි මිස්ව මුණ ගැහෙන්න ආව කාරණයට කෙලින්ම ප්‍රවිෂ්ට වෙන්නම්. මට දැන ගන්ඩ ඔනෙ කුමාරි මිස්ගේ ගුරු ජීවිතේ ගැන තොරතුරු. අපි කථාව ළමා කාලයෙන්ම පටන් ගමු."**

"මගෙ තාත්තාගෙ ගම අම්බලන්ගොඩ අම්මා කුරුණෑගල. තාත්තා රේගු නිළධාරියෙක්. අම්මා ගුරුවරියක්. අපි ගම්පහ පදිංචි වුණේ තාත්තට රැකියාවට ගමන් පහසුව නිසාත් අම්මා වැඩ කළේ මිනුවන්ගොඩ ඉස්කෝලෙක නිසාත්, මගේ පවුලේ සහෝදර සහෝදරියො මාත් එක්ක දහදෙනෙක්. මට අක්කලා පස් දෙනයි, අයියලා තුන් දෙනයි, නංගිලා එක් කෙනයි. මං පවුලෙ නව වෙනියා."

"මගෙ ප්‍රාථමික අධ්‍යාපනය ලැබුවේ ගෝතමියෙන්, මොන්ටිසෝරියෙන් පස්සේ මාව පළවෙනි පංතියට නෙමෙයි දෙවෙනි පංතියටයි ඇතුලත් කළේ. ඒ කාලෙ ඩබල් ප්‍රමෝෂන් කියලා ක්‍රම වේදයක් අධ්‍යාපන ක්ෂේත්‍රයේ තිබුණා. මේ අවස්ථාව මට දෙවරක් හිමි වුණා. දෙවෙනි පංතියෙන් හතරවෙනි පංතියට ඇතුලත් වුණේ. ලස්සන වැඩේ කියන්නෙ මේ ඩබල් ප්‍රමෝෂන් දෙවරක්හිමිවීම නිසා මගෙ එක අයියා කෙනෙක් මට පහළ පංතියක ඉගෙන ගන්නෙ."

"හයවෙනි පංතියේ ඉඳලා උසස් අධ්‍යාපනය ඉවරවෙනකම් මගෙ පාසල ගම්පහ රත්නාවලී බාලිකා විද්‍යාලයයි. හයවෙනි පංතියේ ඉගෙන ගනිමින් ඉන්නකොට මගෙ පියා මිය යනවා. අ.පො.ස. සමාන්‍ය පෙළ සහ උසස් පෙළ මං පළමු වතාවෙන්ම විශිෂ්ට අන්දමින්ම සමත් වෙනවා. ඒ අවුරුද්දෙ විශ්ව විද්‍යාලයට තෝරා ගත් දිස්ත්‍රික්කයේ පළමු දෙවෙනි සහ තුන්වෙනි ස්ථාන රත්නාවලියට හිමි වෙනවා. ඒ ස්ථාන තුනත් එකම පංතියේ හිටිය අපි යාළුවෝ තුන් දෙනෙක් හිමිකර ගන්නෙ."

මගෙ විශ්ව විද්‍යාලය කොළඹ විශ්ව විද්‍යාලයයි. මං බලාපොරොත්තුවුණේ නීතිය හදාරන්නයි. නමුත් අයියලගෙ මැදිහත්වීම නිසා මම ඒ අදහස අත් අරිනවා

**"මම හිතන්නෙ එහෙම වුණේ නැත්නම් කුමාරි මිස් වගේ ගුරුවරියක් බණ්ඩාරනායකෙට අහිමි වෙනවා කියලයි."**

"එහෙම වෙන්ඩ පුළුවන්කම තිබුණා. මං ආර්ථික විද්‍යා විශේෂ උපාධියක් හැදෑරුවේ. පළවෙනි අවුරුද්දෙ මං බැච් ටොප් වුණා. තුන් වෙනි අවුරුද්දෙත් මං බැච් ටොප්. හතරවෙනි අවුරුද්දේ එක ලකුණකින් බැච් ටොප් මිස් වුණා. හතරවෙනි අවුරුද්ද අවසාන වෙනකොටම මට රැකියාවක් ලැබුණා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ. එතනදී මට තනතුරක් වගේම හොඳ වේතනයකුත් ලැබුණා."

"අධ්‍යාපනය එක දිගට හැදෑරීමෙනුත් ඒ එක්කම රැකියාවක් ලැබීමෙනුත් ජීවිතයට විරාමයක් තිබුණෙම නෑ වගේ. මේ නිසා මගේ මාස්ටර් කිරීමේ සිහිනය බිඳ වැටෙයි කියලා මට බයක් ඇති වුණා. මේ ගැන පසුතැවිල්ලෙන් ඉන්නකොට මගෙ අම්මා තමයි මාව ගුරු වෘත්තියට යොමු කළේ."

"1988 මගෙ පළමු පත්වීම ලැබෙන්නෙ අනුරාධපුර ශ්‍රාවස්තිපුර කුඩා නෙළුබැව ගැමුණු මහා විද්‍යාලයට. මං පාසලට යන කොට හිටියේ තිලකසිරි කියලා තරුණ විදුහල්පතිවරයෙක්. මාත් එක්ක කථාබහ කිරීමෙන් අණතුරුව විදුහල්පතිතුමා මට අභියෝගයක් භාර දුන්නා. ඉතිහාසයේ කිසිම දවසක ඒ පාසලෙන් විශ්ව විද්‍යාලයට ළමයෙක් ගිහින් නෑ එක ළමයෙක් හරි විශ්ව විද්‍යාලයට යවන්න සමත් කරලා දෙන්න කියලා. මම අභියෝගයභාර ගත්තා. හැබැයි මම විදුහල්පතිතුමාගෙන් අවසරයක් ඉල්ලුවා පාසල නිමාවීමෙන් පස්සේ හවස උගන්වන කොට සාමාන්‍ය ඇඳුමක් අඳින්ඩ. ඒ මොකද දන්නවද ඒ වෙනකොට මට සාරි අඳින එක එච්චරටම හුරු නැති නිසා. ඉතින් මම විදුහල්පතිතුමාගෙත් ගුරුවරුන්ගෙත් උදව්වෙන් කාල සටහනක් හැදුවා. ඒ අනුව අපි ක්‍රියාත්මක වුණා."

"මේ උසස් පෙළ ළමයින්ට උගන්වන්න පටන් ගත්තදා ඉඳලා මං බෝඩිමට ගියාට දවල්ට බත් කැවෙ නෑ. මොකද මේ ළමයි බඩ ගින්නෙ. සමහරු උදේට කාලත් නෑ. එච්චරටම දරිද්‍රතාවයක් මේ ප්‍රදේශයේ හිටපු ළමයින්ව වෙලාගෙන තිබුණා. අසෝක කියලා ළමයෙක් හිටියා. මම මේ ළමයාට සල්ලි දීලා අපි සේරටම බනිස් ගෙන්න ගෙන කනවා. ඒ අසෝක තමයි පසු කාලයක මේ විදුහලේම විදුහල්පති බවට පත් වෙන්නෙත්."

> **මේ දරුවන්ගෙ සෙනෙහස මාව අඬවනවා...**

**"හරි දැන් මට පොඩි ගැටලුවක් මතු වෙනවා. කුමාරි මිස් හදපු ගෝලයෝ විදුහල්පතිවරු බවට පත් වෙනවා. ඇයි කුමාරි මිස් මෙච්චර දක්ෂතාවයක් තියාගෙන ඒ පැත්තට යොමු නොවුණේ."**

"මෙහෙමයි ශානාත් විදුහල්පති භූමිකාවට ඇතුලත් වෙන්ඩ මගෙ කොහෙත්ම බලාපොරොත්තුවක් තිබුණෙ නෑ. නමුත් ඇඩ්මිනිසට්‍රේෂන් පැත්තට යොමු වෙන්ඩ මට අදහසක් තිබුණා. නමුත් ඒ සඳහා විභාග තිබුන දිනවල පාසලේ පඩිපෙළියකින් වැටිලා මාව තුවාල වෙනවා. මට විභාගෙට පෙනී හිටින්න බැරි වෙනවා. නැවත ඊළඟ අවුරුද්දෙ උත්සාහ කරන්න බැරි වෙනවා ඒ සඳහා වන වයස් සීමාව පහුවෙන නිසා."

"කොහොම හරි නෙළුබැව ගැමුණු මහා විද්‍යාලයෙන් දහතුන් දෙනෙක් විශ්ව විද්‍යාල ප්‍රවේශය ලියනවා. මං භාරගත්ත අභියෝගය මට ජය ගන්ඩ පුලුවන් වෙනවා. ප්‍රථිපල විශිෂ්ටයි. දහතුන් දෙනාගෙන් දහ දෙනෙක් විශ්වවිද්‍යාලයට තේරුණා. මේ මෑත ඉතිහාසයේ දවසක ගැමුණු විද්‍යාලයේදී මා වෙනුවෙන් උපහාර උත්සවයක් පැවැත්වුණා."

"දුෂ්කර සේවය අවුරුදු හතර නිම කරලා මං ගම්පහට එනවා. මං උසස් අධ්‍යාපනය ලබාගත් රත්නාවලිය හරි බණ්ඩාරනායකේ හරි මට තෝර ගන්ඩ සිදු වෙනවා. මම මා ඉගෙනගත් පාසල අත හැරලා බණ්ඩාරනායක විද්‍යාලය තෝරා ගන්නවා."

"1992 වර්ෂයේදී තමයි මම බණ්ඩාරනායක විද්‍යාලයට එන්නෙ. එතන ඉඳලා අවුරුදු විසිපහක් මං එක දිගට බණ්ඩාරනායක විද්‍යාලයට සේවය කළා. මට මතක විදිහට විදුහල්පතිවරු දහ දෙනෙක් යටතෙ මං වැඩ කරලා තියෙනවා. ඔය කාලෙ ඇතුලත තුන් සැරයක් මට මාරුවීම් ආවා. ඒ සියල්ලම විදුහල්පතිවරු මැදිහත්වෙලා අවලංගු කර ගත්තා. හතරවෙනි අවස්ථාවෙත් විදුහල්පතිතුමා මැදිහත් වුණා මාරුවීම අවලංගු කර ගන්ඩ. නමුත් මම ස්ව කැමැත්තෙන්ම ක්‍රිස්තුරාජෙට යනවා. විදුහල්පතිතුමා ක්‍රිස්තුරාජෙ පියතුමා සමග කථා කරගෙන තිබුණා මාස හයකින් මාව නැවතත් බණ්ඩාරනායක විද්‍යාලයට මාරුකර ගන්ඩ. එයම හේතුවක් වෙනවා ක්‍රිස්තුරාජෙ පියතුමා මාව නිදහස් නොකරන්න. මං විශ්‍රාම ගන්නා තෙක් අවුරුදු දෙකහමාරක් කිස්තු රාජෙට සේවය කළා. මං මගෙ සේවය අකුරට නෙමෙයි ඊටත් වැඩියෙන් මේ පාසල් තුනටම ලබා දුන්නා කිව්වොත් නිවැරදියි."

**"හරි කුමාරි මිස් මට විශේෂයෙන් දැන ගන්ඩ ඕනෙ බණ්ඩාරනයක විද්‍යාලයේ කාර්‍යභාරය මොකක්ද කියලා."**

"බණ්ඩාරනායක විද්‍යාලය කියන්නේ මගෙ ජීවිතයෙන් කොටසක් කියලා කිව්වත් වැරදි නැහැ. අවුරුදු විසිපහක කාලයක් එක දිගට බණ්ඩාරනායක විද්‍යාලයට සේවය කළා. මං ඒ තරම් දුරට මේ පාසලට බැඳෙන්ඩ හේතුව තමයි මං උගන්නපු වාණිජ අංශයේ පමණක් නෙමෙයි මා එක්ක වැඩ සටහන්වලට සම්බන්ධ වුණ අනෙක් අංශවල දරුවොත් මට මවකට මෙන් දක්වපු සෙනෙහස. ශානාත්, මේ ආදරය මාව අඬවනවා කිව්වොත්

12 » පිටුවට

11 පිටුවෙන්

නිවැරදියි. මවක් නොවුණ මම ගුරුමවක් වෙලා මේ දරුවන්ගෙන් මෙච්චර සෙනෙහසක් ලබන්නෙ පූරුවෙ කරපු පිනක් නිසා වෙන්ඩ ඇති. ඒ වාගෙම ශානාත් ඔයා විශ්වාස කරන එකක් නෑ බණ්ඩාරනායක විද්‍යාලයට ඇවිත් අවුරුදු පහකට පස්සෙ ඉඳලා කවදාවත් සාරියක් සල්ලි දීලා අරගෙන නෑ. මේ දරුවො මගෙ හැම උපන් දිනේකටම තෑගි දුන්නෙ සාරි."

"මේ බොහෝ දරුවන්ගේ දෙමව්පියන් එක්කත් මම සම්බන්ධ වෙලා හිටියා. සමහර දරුවො අදටත් මට ස්තූති කරනවා ඒ ගොල්ලන්ට ජීවිතය දුන්නෙ මං කියලා. මං විශ්‍රාම ගිහින් හිටියත් මගෙ උපන් දිනේ දවසට මාව බලන්ඩ තාමත් එන බොහෝ දරු පිරිසක් ඉන්නවා. ගොඩ දෙනෙක් විදේශ ගතවෙලා හිටියත් මාව අමතක වෙලා නෑ ඉඳලා හිටලා හරි මට කථා කරනවා. ඒ වගේම මේ සමහරු පාසල් කාලෙදීම මට දුන්න ලිපි බොහෝ එකතුවක් මා ළඟ තියෙනවා. ශානාත් මගෙන් ඇහැව්ව විදිහට මම කොහොම ද පාසලේ වැඩ කටයුතු වලට සම්බන්ද වුණේ කියලා කියන්නම්."

"මම ආර්ථික විද්‍යාව විෂය ප්‍රධානි, වාණිජ අංශ ප්‍රධානි විදියට කටයුතු කළා. ඒත් එක්කම ශිෂ්‍ය නායක මණ්ඩලය, විනය කමිටුව, බෞද්ධ සංගමය, වාණිජ සංගමය වගේ සංගම් භාරව කටයුතු කළා. ඊට අමතරව පාසල් කළමණාකරන කමිටු ලේකම්, ජාතික ඵලදායිතා කමිටුවේ වාණිජ්‍ය අංශය භාර ආචාර්ය, උසස් පෙළ ව්‍යාපෘති භාර ආචාර්ය, වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය හා වාර්ෂික වාර්තාව සැලසුම් කමිටුව භාරව කටයුතු කළා ඒවගෙම ක්‍රීඩා කමිටුවට සහ පාසල් සංවර්ධන සමිතියට දායකත්වය ලබා දුන්නා. ඊට අමතරව ලංකාවේ ප්‍රථම ව්‍යාපෘති පුස්තකාලය සහ රන් කැකුළු සංසදය ආරම්භ කිරීමට මගේ දායකත්වය ලබා දුන්නා."

**"කුමාරි මිස්ගේ ගුරු ජීවිතය අවුරුදු තිස් දෙකක් පමණ වෙනවා කියලා දන්නවා. අවසාන වශයෙන් මේ සාකච්ජාව නිමා කරන්ඩ යමක් කියන්ඩ තියෙනවාද."**

ඔව් ශානාත්, මම එදත් අදත් හෙටත් බණ්ඩාරනායක විද්‍යාලයට ආදරෙයි. පාසලේ වැඩ කරද්දි මට වෙලාවක් කලාවක් තිබුණෙ නෑ. මම පාසල ඇරිලා වෙලාවට ගෙදර ගිය දින ගණන අතේ ඇඟිලි ගාණක් වෙන්ඩ ඇති. බොහෝ විට පාසලෙන් ගෙදර ගියේ පහට හයට විතර. මම ගුරු ප්‍රතිභා ප්‍රභා සම්මානය දිනා ගත්තා. ඊට කලින් කවුරුවත් මේ සම්මානය දිනාගෙන තිබුණෙ නෑ. ඒ වාගේම මගෙන් පස්සෙ කවුරුවත් මේ සම්මානය ලබා නොගැණීමත් කණගාටුදායක කාරණයක් මේ දරුවො මා වෙනුවෙන් කරපු අමතක නොවෙන දෙයක් ඔයාට කියන්නම්. මගෙ අම්මා මිය ගිය අවස්ථාවෙ මේ දරුවො මල් ශාලාවෙ බිල සම්පූර්ණයෙන්ම ගෙවලා තිබුණා. අපි දරුවො දහ දෙනෙකුට කරන්ඩ දෙයක් එතන ඉතුරු වුණේ නෑ. මේ දරුවො මං වෙනුවෙන් ඒ දේ කරනකම් ඇත්තටම මම දන්නෙ නැහැ. ඉතින් මේ දරුවන්ගෙ සෙනෙහස මාව අඬවන එක කියන්ඩ දෙයක් නෙමෙයිනෙ. අවසාන වශයෙන් පාසලේ ඉගෙනගත් ඉගෙන ගන්නා සියළුම දරුවන්ගෙ අනාගතය සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා කියලත් බණ්ඩාරනායක විද්‍යාලය ජය මාවතේ ඉහලටම නැගේවා කියලත් මං ඉති සිතින් ප්‍රාර්ථනා කරන්නම්."

**සාකච්ඡා කළේ : ශානාත් ජයසූරිය**

09 පිටුවෙන්

මම මගේ ජීවිතයට හරි ආදරෙයි. මගේ ළදරු කමට මං හරි ආසයි. මම කොච්චර වයසට ගියත් පාසල් දරුවකු විදියට තමයි හැසිරෙන්නේ. ඒ නිසයි මට අදටත් 87 වසර කණ්ඩායමේ නායකයා හැටියට මගේ සමකාලීන සොඳුරු මිතුරන් සමඟ විනෝදයෙන් කෙළිදෙලෙන් බන්ඩාරනායන විදු මවගේ පහස ලබන්නට හැකිව තිබෙන්නේ. ( මෙහෙම කියද්දී ඔහුගේ මුහුණ සොඳුරු අව්‍යාජ සිනාහවකින් සිත්තම උනා)

**☑ ඔබව අපි නිරතුරුවම දකින්නේ සුන්දර වූ අව්‍යාජ සිනාවක් මුව රඳවා ගෙන හැසිරෙන තෘප්තිමත් ජිවිතයක් විලාශයකින්.. ඔබ මෙතරම් සැහැල්ලු ගන කරන රහස හෙලි කලොත්?**

එකම රහස තමයි යම් කිසි කෙනෙක් දකින්න ඕනී තමන් කොතැනද ඉන්නේ, තමන් මොනවද කරන්නේ. තමන් කවුද කියලා, ඔය ටික හඳුනා ගත්තට පස්සේ තමන්ට ඒ ඔක්කොම ලැබිලා තියෙන ක්‍රමය මොකද්ද කියලා බලන්න ඕනෑ. අපේ වෘත්තිය මම ඉගෙන ගත්ත විදිහ අනුව ක්ෂේත්‍රයේ නමක් කියාගෙන ඉන්නවා. සමාජයෙන් මට ලොකු ගෞරවයක් හම්බ වෙනවා. මේක සමාජ ගෞරවය ලබන්න සුදුසු ක්ෂේත්‍රයක් තෘප්තිමත් රැකියාවක්. මගේ ජීවන රටාවට මේක හොඳට ගැලපෙනවා. ප්‍රශ්නය ප්‍රශ්නයක් කරගැනීම මිසක් ප්‍රශ්නය ව්‍යසනයක් කර නොගැනීම මගේ ක්‍රමයයි.

**☑ ඉතින් ලසන්ත මල්ලි......අපේ කථාවේ අවසන සනිටුහන් කරන්නට මත්තෙන් ඔබේ යුග දිවිය ගැන, දයාබර බිරිඳ ගැන, දයාබර එකම දියණිය ගැන යමක් පැවසුව හොත්? ඒවගේම ඔබගේ ව්‍යාපාරයේ මිලඟ ඉදිරි දැක්ම දුව චලනි නේත්‍රා කිව්වොත් මම නිවැරදියි නේද?**

ඇත්තටම අයියේ මගේ බිරිඳත් මේ ක්ෂේත්‍රයේ ඉන්නේ. ඇය අරුණි විමලසූරිය. මගේ එකම දුව චලනි නේත්‍රා. මගේ ඇස් දෙක. නේත්‍රා මෙම ක්ෂේත්‍රය ගැන උනන්දුයි. එයා මේ සම්බන්ධව වැඩිදුර අධ්‍යාපනය ලබන්නට විදේශ ගත වෙලයි ඉන්නේ. ඔව් මේ වෙන කොටත් මගේ ඊළඟ ඉලක්කය ඊළඟ ආයෝජනය මගේ දුව. ඇගේ චලනය වෙන සජීවී දෙනෙතින් මගේ සිහිනය ඉෂ්ඨ කරාවී යැයි කියා මගේ ලොකු විශ්වාසයක් තියෙනවා හැබැයි පුංචි කාලේ ඉදලම මගේ දැක්ම මගේ ගමන පුරුදු කරල ඉවරයි. මම හිතනවා එයා ලංකාවට ඇවිල්ලා මට වඩා ලොකු දෙයක් ගම්පහ ජනතාවට කරමින් මටත් එහා ගිය සුන්දර ගමනක් යාවී කියලා. එයයි මගේ සැබෑවන සිහිනය.

මගේ ඊළඟ ප්‍රාර්ථනාව හා අභිලාශය. ලෝකය "නිවැරදිව දකින්නට " වෙර දරන මානව සම්පතේ හෙට දවස වෙනුවෙන් යහපත් වූ මෙහෙවරක යෙදී සිටින ඔබට, යහපත් වූ හෙට දවසක් හෘදයාංගමව ප්‍රාර්ථනා කරමින් නැවත දවසක හමුවන රිසියෙන් මා සමුගන්නම්....

**සංවාද සටහන - ප්‍රියන්ත මිරිහාගල්ල**

**J.A. Wimalasooriya Opticians**

No. 4/8, YMBA Building, Gampaha

"Nethra" Building, No.152, Colombo Road, Gampaha

+94 33 222 4170

06 පිටුවෙන්

පාඩම් කරන පොත කියන සංකල්පය අපිට හඳුන්වා දුන්නා. ඒ කියන්නේ අපි ගෙදර ගිහින් නියමිත පැය ගාණක් පාඩම් කරන්න ඕනි. පාඩම් කරලා අම්මලාගෙන් අත්සන් කරන් එන්න ඕනි පාඩම් කලා කියලා. ඇත්තටම ඒකත් එක්ක තමයි මම පිළිවෙලකට පාඩම් කරන්න පටන් ගත්තෙ.

මට මේ ජයග්‍රහණය ගැන ගොඩක් සතුටුයි. 12 වසරේ පන්තිභාර ගුරුවරයා විදියට කටයුතු කරපු ගුණතිලක සර් ඇතුලු සියලුම ගුරුවරුන් මම මේ වෙලාවෙ මතක් කරනවා. 6 වසරේ උගන්වපු ලංකාතිලක මැඩම්වත් මම මතක් කරනවා. තොරතුරු තාක්ෂණ අංශයෙන් විශ්වවිද්‍යාලයට ඇතුලුවෙලා උපාධිය ලබාගෙන රටට සේවයක් කිරීම තමයි මගේ බලාපොරොත්තුව.

**2023 අපොස උසස් පෙළ විභාගයේ ජීව විද්‍යා අංශයෙන් ගම්පහ දිස්ත්‍රික්කයෙන් දෙවන ස්ථානය ලබා ගත් චතුක අනුජය කරුණාතිලක සකිසඳට මෙසේ අදහස් දැක්විය.**

මගේ ගම ජාඇල. මගේ පවුලේ ඉන්නේ තාත්තයි අම්මයි මමයි මල්ලියි. මගේ තාත්තා පෞද්ගලික සමාගමක රැකියාව කරනවා. අම්මා ගෘහණියක්.

මම කඳාන ධර්මාශෝක මහා විද්‍යාලයේ ඉගෙනුම ලබලා ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 173 ක් ලබාගෙන බණ්ඩාරනායක විද්‍යාලයට ඇතුළත් උනා. පොඩි කාලෙ මගේ බලාපොරොත්තුව තිබුනේ මළල ක්‍රීඩකයෙක් හැටියට ඉදිරියට යන්න. මම 7, 8 ශ්‍රේණිවලදි මීටර් 100, මීටර් 200 ඉසව්වලින් ජයග්‍රහණ ලබාගත්තා. ඒත් 8 වසරෙදි වලලුකරේ ආබාධයක් ඇති වෙලා මට ක්‍රීඩා කිරීම නතර කරන්න සිදුවුනා. මගේ ක්‍රීඩා පුහුණුකරු විදියට කටයුතු කරපු හර්ෂ සර් මම මතක් කරන්න ඕනි.

මම පොඩිකාලෙ ඉඳන්ම චිත්‍ර අඳින්න ආසයි. මම 6 , 10 ශ්‍රේණිවලදි සමස්ථ ලංකා චිත්‍ර තරඟයෙන් පළමුවෙනියා වෙලා තියෙනවා. ඒ වගේම වෙනත් ආයතනවලින් පැවැත්වූ තරඟ ගණනාවකින්ම පළමු ස්ථානය දිනාගෙන තියෙනවා. ඊට අමතරව මම ප්‍රශ්ණෝත්තර තරඟවලට සහභාගී වෙලා පළමුවෙනි ස්ථාන දිනාගෙන තියෙනවා. මම 10 ශ්‍රේණියේදි ගණිත ඔලිම්පියාඩ් තරඟයෙන් බස්නාහිර පළාත් දෙවන ස්ථානය දිනා ගත්තා.

ඒවගේම මගේ පන්තිභාර ගුරුවරයා, මංජුල සර්වත් රාසායනවිද්‍යාව ඉගැන්වූ ඉරේෂා මැඩම්වත් භෞතික විද්‍යාව ඉගැන්වූ අරුණ සර්වත් බොහොම ගෞරවයෙන් මතක් කරනවා.

මගේ බලාපොරොත්තුව ස්නායු රෝග විශේෂඥ වෛද්‍යවරයෙක් වීමයි.

**තිලිණ ප්‍රියසාද්**

# මතකයන් පිරුණු එදවස.... 01

## "සකිසඳ " කියන්නේ තමන්ගේ හොඳම යාළුවට...කළණ මිතුරාට....

බණ්ඩාරනායක විදුමව තුරුළුවට ආපු හැමෝම
යම් යම් දේවල් සමගින් ලෝකයේ එක්තැනක
තමන්ගේ නම සටහන් කරගෙන ඉන්නවා දකින
එක තරම් විදුමවට වෙන සතුටක් නැහැ ....

අපි හැමෝම විවිධ කාලවල ස්කෝලේට ඇවිත්
,ස්කෝලෙන් ඈතට ගිහින් ,ජීවිතය ගෙවන,
ආදී ශිෂ්‍යයින් බවට පත්වෙනවා....
අපි ආදී ශිෂ්‍යයින් බවට පත්වුනහම පාසල
හා තියෙන බැඳීම ටිකක් ඈතකට යනවා....
ඒ බැඳීම තව තවත් ඈතකට නොගොස් තබා
ගන්න, හදපු පාලම තමයි, ආදී ශිෂ්‍ය සංගමය. ,

අපි ඒ පාලම තුල එහා මෙහා ඇවිද ගෙන යනවා.
හමුවීම්, එකතුවීම්, සංවාද, වපාපෘති, එක්ක එක
අම්මා කෙනෙක් ගේ දරුවන් ලෙස අපි අපේ
සංවාදයන් ගෙනියන්න හදපු සන්නිවේදන
සහකරු තමයි, "සකිසඳ" කියන්නේ....

"සකිසඳ" නිර්මාතෘවරයා ,දිවංගත කරුණාදාස
සූරියආරච්චි , (කසූරි)ජ්‍යෙෂ්ඨ සොයුරා....
කසූරි අයියා පලවෙනි පත්තරය අරගෙන, අපේ
විධායක කමිටු රැස්වීමට ඇවිත් අපි එකිනෙකාට.
පිටු හතරකට විතර සීමාවුනු පලවෙනි කලාපය
බෙදා දුන්න දවස මට තාම මතකයි...

අපේ ප්‍රධාන ශාලවේ තමයි අපි ඒ කාලයේ
රැස්වීම පවත්වන්නේ , අපිට රැස්වීමක්
පවත්වන්න ඉඩක් තිබුනේ නැහැ ....
ආදීශිෂ්‍ය සංගමයේ කාර්යාලයත් ඇත්තටම
පහල කෙලවරක පුංචි තීරුවක්
වගේ තැනක තමයි තිබුනේ ...

ඉතින් කසූරි අයියා ,ඒ රැස්වීමේ
දී කිව්වා සකිසඳ සංස්කාරක තනතුරට
මම පාලිතව යෝජනා කරනවා කියලා...
ඉතින් කවුරුත් ඒකට විරුද්ධත්වයක්
පෑවේ නැහැ ...
නිහාල් නානායක්කාර අයියා ඒ
යෝජනාව ස්ථිර කලා...
ඉතින්, ඉස්සර අද වගේ ස්මාර්ට් ෆෝන්
තිබ්බේ නැහැ. වට්ස්ඇප් වගේ දේවල්
තිබ්බේ නැහැ ...
ඉතින් ,අපේ කාර්යාලයේ පරිඝණකයක්
තිබුනෙත් නැහැ.

මම ඒ කාලේ රැකියාව
වශයෙන් කලේ පාමසියක්....
ඉතින් විවේකයක් තියෙන හැම වෙලාවකම
යම් යම් දේවල් ලිය ලියා කොලවල පිරෙව්වා...
නිහාල් නානායක්කාර අයියලගේ ගෙවල් කිට්ටුව
මල්ලී කෙනෙක් හිටියා කම්පියුටර් ටයිප් සෙටින්
කරන,එයාව හම්බවෙන්න පුළුවන් වෙන්නේ රෑ
නවයෙන් පස්සේ ..ඉතින් මම පාමසිය වහලා
ගම්පහ කිරිදිවිට යනවා පත්තරයේ පිටු ටික
හදාගන්න .

සමහරක් දවස්වල රෑ එක දෙක
වෙනවා ඉවරයක් වෙනකොට ...
පස්සේ ,පත්තරයේ පිටුවල කොපියක් කසූරි
අයියට ලබා දෙනවා අනුමැතිය සඳහා ...
මට ආපසු ලැබෙන්නේ ගොඩාක් සටහන්
පෑන් ඉරකින් කපා ඉවත් කර
ඇති කොල කිහිපයක් පමණකි....
ඉතින් ,ඒ විදහට මාස පහක් හයක් පිටු ලියනවා..
කසූරි අයියා ඒවා කපලා දානවා ...
පස්සේ ,නිහාල් නානායක්කාර අයියා සහ මම
තීරණය කලා ,කසූරි අයියා කපලා
ඉවත් කරන්නේ නැති ටික
හරි දාලා පත්තරය ප්‍රින්ට් කරමු කියලා....

ඉතින් පිටු දොලහක්ට විතර සීමාවුනු සකිසඳ
පත්තරය ,ඇතුලේ පිටු අටක් විතරම තිබුනේ ,
"බලධාරියා විසින් කපන හරින ලදී" යන පාඨය
විතරයි ...
පස්සේ ,ඉතින් කොහොම හරි
වැඩේ අත්හරින්නත් මට හිතුනා...
ඒත් වැඩේ කරනවා
කියන ස්ථිර තීරණයෙම හිටියා...

අර කිරිඳිවිට මලයත් රැකියාවක් සඳහා
යොමු වුනා.... අපි කාර්යාලය සඳහා
පරිඝණකයක් ලබාදෙන්න කියන පණිවිඩය
සකිසඳ තුලින්ම කලා ...
ඒ ඉල්ලීමට ප්‍රතිචාරයක් විදිහට අපිට
යම්තරමක් පාවිච්චි කරපු පරිඝණකයක්,
අපේ අතුල රනවීර අයියා සහ රම්‍යා රනවීර
අක්කා විසින් පරිත්‍යාග කලා....එය එදා අපිට
විශාල පහසුවක් සහ උදව්වක් වුනා....

පස්සේ ටයිප් සෙටින් කරලා දෙන්න අපිත් එක්ක
රැබේරු මල්ලී එකතු වුනා ..කොහොම කොහොම
හරි අපි සකිසඳ කරගෙන ගියා ......

පස්සේ ,පත්තරය මුද්‍රණය කරන්න අවශ්‍ය කරුද-
ාසි වල අවශ්‍යතාවයත් ,මා සුමිතුරු නන්දන
දයාකුමාර සොයුරා විසින් නොකඩවාම මට ලබා
දුන්නා ...නන්දන පසුව ආරන්‍ය සේනාසනයක
පැවිදිව ,උපනන්ද හාමුදුරුවෝ නමින් මහණදම්
පුරනවා..උන්වහන්සේත් මේ අවස්ථාවේ නමස්කාර
පූර්වකව සිහිපත් කරනවා ..

මේ සකිසඳ නිර්මාතෘවරයාවූ කරුනාදාස
සූරියආරච්චි ජ්‍යෙෂ්ඨ සොයුරාද
මියයන්නට වුනා. එය හදවතට දැනුනු
වේදනාකාරීම දවසක් වුනා....
ආදරණීය කරුඅයියාට නිවන්සුව අත්වේවා...එතුමා
තබාගිය සොඳුරු මතක සටහන් තවඅයෙකුට
තබන්න බැරිවේවී...

උපනන්ද හාමුදුරුවෝ නම් සතියකට
වරක් තාමත් කතා කරනවා....
අපි, උන්වහන්සේටත් පත්තරයක් යවමු....
ඉතිරි කලාපය මඟින් තවත් සුන්දර සකිසඳ
මතකයන් හා එක්වෙමු..

නව සංස්කාරකවරයාට සහ කාර්යය මණ්ඩලයට
මගේ හදවතින්ම සුබපැතුම් එක්කරනවා ...

- පාලිත අධිකාරි -




ජීවිතයට බොහොමයක් දේ ලැබෙන්නේ පාසල සහ අධ්‍යාපනය තුලින් .අපි හැමෝම වැඩියෙන්ම ආදරය කරන්නේ අම්මාට. දෙවනුව පාසලට ,පාසල් මාතාවට. ඉතින් පාසලට ඇතුලු වන දවස තරම් ජීවිතයට සමීප දවසක් තවත් නැතිව ඇති .ඒ වගේම පාසල හැර යන්න වෙන දවසත් ජීවිතයට සමීපම දවසක් වෙනවා. පාසල හැර ගියහම. අවුරුදු ගානක් යන තුරු පාසල් මතකය හදවත තුල රැඳුනත්. එකට හිටපු යාළුවන් විවිධ රැකියවල් වලට සමීප වුනහම, හමුවෙන්න තියෙන තැන තමයි ,පාසැල් ආදීශිෂ්‍ය සංගමය.

ආදීශිෂ්‍ය සංගමයේ තේමාව වුනේ, එන්න අපේ ප්‍රිය මිතුරේ. ඉතින්, එය ලස්සන සුන්දරතම තේමාවක්. කොහොම හරි පුංචි කණ්ඩායමක් ,ආදීශිෂ්‍ය සංගමයේ ආරම්භයට ඇරඹුමක් දුන්නා. එක්තරා ලස්සන ඉරිදාවක, අපි ආදීශිෂ්‍ය සංගමයක් පිහිටවමු යන පණිවිඩය අරගෙන කට්ටියක් ස්කෝලෙට එකතු වුනා. එදා ඇත්තටම ආරම්භයට පහන්සිළු දල්වන්න පොල් තෙල් පහනක් අපිට තිබුනේ නැහැ. අපි පොල්තෙල් පහනක් ඉල්ලගෙන ආවේ. රත්නාවලී බාලිකා විද්‍යාලයෙන්. කොහොම හරි ඒ ලස්සන සුන්දර ආරම්භය එදා අපේ ජ්‍යෙෂ්ඨයන් ආරම්භ කලා.

ඉතින්, පුංචි අංකුරයක් විදිහට එදා පටන් ගත්ත, මේ සෙනෙහසේ නවාතැනට, පොල්තෙල් පහනක් අපිම ගත්තා. ඒ, ආරම්භක රැස්වීමේදිම. HAT COLLECTION එකක් කරලා. තොප්පියකට එකතු කරපු ඒ පුංචි ආරම්භය තුලින්, සාමාන්‍ය සාමාජිකත්වයේ සිට යාවජීව සාමාජිකත්වයක් දක්වා වැඩි දියුණුවට පත්වුණා .

එදා සාමාන්‍ය සාමාජිකත්වය , රුපියල් දෙසීයක් පමණකි. එය වසරකට සීමාවුනි. යාවජීව සාමාජිකත්වය, රුපියල් දහසකි. එය ජීවීත කාලයටම වලංගුය......

ඉතින්, පොල්තෙල් පහනෙන් පටන් ගත්ත අපි, පාසලට කෝස්ටර් බස්රථය. පරිඝණක විද්‍යාගාරය, ගුරු විවේකාගාරය, විදුහල්පති නිලකාර් රථය, ශිෂ්‍යත්ව අරමුදල, දෙමහල් ආදීශිෂ්‍ය සංගම් කාර්යාලය, සෙනෙහසේ පුස්තකාලය, ලේලන්ඩ් බස්රථය, ප්‍රධාන ශාලාවට නවීන වර්ගයේ පුටු ලබාදීම, කිරිහල, පහ වසර ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ, දඹාන පාසලට පුංචි ක්‍රීඩා පිටියක් ලබාදීමට ආධාර, ත්‍රිකුණාමලය මිහිඳුපුර විද්‍යාලයේ පුස්තකාලය ඉදිකිරීමට ආධාර, විද්‍යාලයේ, ශිෂ්‍යභට පෙර අපරදිග කණ්ඩායම් සඳහා නිළඇඳුම්, සපත්තු ලබාදීම, ක්‍රීඩා කණ්ඩායම් සඳහා නිල ඇඳුම් සහ ක්‍රීඩා උපකරණ, සංගීත භාණ්ඩ, වශයෙන් ලියාගෙන යන්න පුළුවන්. මේ හැමදෙයක්ම ආදරණීය පාසල් මාතාවට කරන ලද කෘතගුණ සැලකීමකි.

අපිට ලබාදුන් විශාලම අභියෝගය වුනේ. පිහිනුම් තටාකය ඉදිකිරීම් සහ එහි අරමුදල තර කිරීමයි. ඉතින් ,අපි සංගමයක් වශයෙන් ,ඒ අභියෝගයත් ජය ගත්තා. ඉතින්, තව ගොඩාක් දේවල් සමඟින්, පාසලට ආදරය කරමු. අපේ යෝධ ශක්තිය, එකමුතුව තුලින් පාසල ගොඩනඟමු.

වර්තමාන තාරුණ්‍යය ජවය නිර්මානශීලීත්වය. සමඟින් හෙට දවස තවත් ජයග්‍රාහී මාවතකට. යන්න හැකිවේ යැයි යන විශ්වාසය තියාගන්න පුළුවන්. මන්ද, සරලවම කිවුවොත් අපේම සගයෙක් විදුහල්පති භූමිකාවට ඇවිත් තියෙනවා, ඉතින්, එයම ඇති අනාගතයේ සුබ පෙරනිමිති ගැන පහන්එලි දකින්න. දිනේවා.විදුමව. ඉතින් එදා අපේ තාරුන්‍යය. මෙදා ඔබේ තාරුන්‍යයයි. අපි එදෙස බලා ඉදිමු. ජයමවේවා, සහෝදරත්වයට. විද්වාන් සර්වත්‍ර පූජ්‍යතේ.

**පාලිත අධිකාරි**

### *ජයබිම අපගේ......... නමදිමු බණ්ඩාරනායක විදුහල් මාතා.....!*

අපේ විදුබිමට දැන් වසර 106 ක් වෙනවා. ඒ වුණාට කාලයත් සමග විදුහල දියුණු වුණත්, පාසල් ගොඩනැගිලි නම් අවශ්‍ය තලයට නඩත්තු වෙලා නෑ. ඒ නිසා බණ්ඩාරනායක ආදි ශිෂ්‍ය සංගම් බලකායේ සුදුසුකම් ලත් වරලත් ඉංජිනේරුවන් පිරිසකගේ මූලිකත්වයෙන් පාසලේ යටිතල පහසුකම් පිළිසකර කිරීමේ වැඩ පිළිවෙලක් සූදානම් කරලා තියෙනවා.

**විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය හා අප සැම එකතු වී එකාමෙන් විදුමව හැඩ කරමු.**

- මේ සඳහා මූල්‍ය අනුග්‍රහය ද, වසර කණ්ඩායම් හරහා ලබා ගැනීම මුඛ්‍ය පරමාර්ථය වෙනවා.
- ඉතාම අත්‍යවශ්‍යයෙන් කළ යුතු යටිතල පහසුකම් අතර,

01. ගොඩනැගිලි අංක 01 හි වැඩ කටයුතු ඉදිරි දිනක දී ආරම්භ කිරීමට දැනටමත් සූදානම් කර ඇති බව සතුටින් දන්වා සිටිමු.
02. ඇමතුම් පද්ධතිය ප්‍රතිස්ථාපනය කිරීම.
03. ගොඩනැගිලි අංක 02,05 සහ 06 පිළිසකර කිරීම.
04. විදුහල් ප්‍රධාන ශාලාව පිළිසකර කිරීම, වැඩි දියුණු කිරීම සහ යාවත්කාලීන කිරීම.
05. විවේකාගාරයන් නවීකරණය කිරීම.
06. ජල නල පද්ධතිය සහ විදුලි පද්ධතිය වැඩිදියුණු කිරීම.
07. යෝජිත නව ගෘහස්ථ ක්‍රීඩාගාරයේ ඉදි කිරීම.

මෙහිදී අංක 02 ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු මූලික වශයෙන් ආදර්ශ ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කරනවා. මෙම ගොඩනැගිල්ල ඉතා අබලන් තත්ත්වයේ තියෙන එකයි ඒකට හේතුව වෙලා තියෙන්නේ. වහල, සිවිලිම බිත්ති සහ පොළොව ඉතා ඉක්මනින් පිළිසකර කළ යුතුව තිබෙනවා.

- මේ සඳහා ආදි ශිෂ්‍ය සංගමය මගින් ටෙන්ඩර් කැඳවා, අඩුම ලංසුව තෝරාගෙන තියෙනවා. රුපියල් ලක්ෂ හැත්තෑවක ඇස්තමේන්තුගත මුදලක් ඒ සඳහා වැය වන බව දක්වා තිබෙනවා.
- විදුහල්පතිතුමා සහ ආදි ශිෂ්‍ය සංගමය සහතික කර ඇති පරිදි මෙම කාර්යය සඳහා මුදල් ලැබීම් සහ වියදම් ඉතා ඉහළ විගණනයකට සහ පාරදෘශ්‍ය භාවයකට යටත්ව සිදු කරනවා.
- සියලු වියදම් සහ ලැබීම් සෑම දෙනාගේම දැනගැනීම පිණිස යාවත්කාලීන කරනවා.

මේ සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන තාක්ෂණික කමිටුව පහත නම් සඳහන් ආදි නායකවරුන්ගෙන් සමන්විත වෙනවා.

01. මහේෂ් මාරසිංහ (1987 වසර කණ්ඩායම)
02. චරක රත්නාකර (1991 වසර කණ්ඩායම)
03. බුද්ධික එදිරිසූරිය (1997 වසර කණ්ඩායම)
04. ප්‍රසන්න නාරන්ගොඩ (1997 වසර කණ්ඩායම)
05. එරන්ද අධිකාරි (1997 වසර කණ්ඩායම)
06. සමන්ත හේවගේ (2002 වසර කණ්ඩායම)
07. දමින්ද එදිරිසිංහ (2002 වසර කණ්ඩායම)

***ආදි නායකවරුනි, ඔබගේ නොමසුරු අනුග්‍රහය අපට අවශ්‍යම මොහොතයි මේ......***

***අපගේ ජය භූමිය...... වර්තමාන හා අනාගත දරුවන්ගේ ජය භූමිය බවට පත් කිරීමත් ......තව බොහෝ කාලයක් තබා ගැනීමත් අපගේ අරමුණ වේ.***

**Account Information:**
A/C No: 1000722060
A/C Name: PPA of Bandaranayake College
Bank: Commercial Bank, Gampaha
Reference: [Your Batch][Your Names with Initials]

වැඩි විස්තර සඳහා පහත ලින්ක් එක බාගත කරගන්න- https://www.bcoba.lk/helpBC/

මෙයට
විධායක ලේකම් - ආදි ශිෂ්‍ය සංගමය
**වැඩි විස්තර සඳහා අමතන්න (එරන්ද අධිකාරි - 077-7332104)**
**නියෝජ්‍ය සභාපති- ආදි ශිෂ්‍ය සංගමය**




# RESTORING THE PRIDE LOTTERY

## #1 Dubai

Emirates

**Travel Dates (15 Sep - 18 Sep)**

02 Persons
03Nights / 04 Days

Return Air Ticket with Emirates
30 Days UAE Tourist visa with insurance
Hotel - Citymax Hotel Bur Dubai / Admiral Plaza Hotel Bur Dubai (Standard Room)
Package Inclusions: - 3 Night Accommodation in Mention above Hotel
Breakfast Basis
Return Dubai Airport Transfer on PVT Basis
Desert Safari with BBQ Dinner
Marina Dhow Cruise with Dinner (Dorby)
Half Day Dubai city tour Burj Khalifa ticket with Transfer 124th floor Non-Prime time
All Transfer & Sightseeing on SIC Basis

## Investment for your Dream Vacation

## #2 Malaysia

02 Persons
03Nights / 04 Days

**Cash Price**
**30,000**

Return Air fare (Including Taxes)
Malaysia Visa Fee
Return Airport Transfers
Hotel Accommodation 3*
Breakfast
Kula Lumpur Half day City Tour
Batu Caves
Genting highlands Full Day tour
Sunway Lagoon
Putra Jaya (Photo Stop)

## #3 Malaysia

**Travel Dates (20 Aug - 31 Aug)**

Return Air fare (Including Taxes)
Malaysia Visa Fee
Return Airport Transfers
Hotel Accommodation 3*
Breakfast
Kula Lumpur Half day City Tour
Batu Caves
Genting highlands Full Day tour
Sunway Lagoon
Putra Jaya (Photo Stop)

02 Persons
03Nights / 04 Days

## #4 Rathmalana TO Jaffna

Return Air Fair for 02 person
**Travel Period (1 Aug - 4 Aug)**

Cassna 208B Grand Caravan EX air Craft

## #5 Hotel Riu

All Inclusive 24h

*Unlimited Food and Baverage*

5 Star Hotel.
Full board stay for 2 people.
Pool access

**Travel Period (1 Aug - 30 Sep)**

## #6 Cinnamon Bay

Beruwala

5 Star Hotel.
Full board one night stay for 2 people.
Pool access

**Travel Period (1 Aug - 30 Sep)**

## #7 Ananthaya Resort

Chilaw

4 Star Hotel.
Full board one night stay for 2 people.
Pool access

**Travel Period (1 Aug - 30 Sep)**

## #8 Tri by Amaya

Ahangama

- 4 Star Hotel.
- Full board one night stay for 2 people.
- Pool access

**Travel Period (1 Aug - 30 Sep)**

## #9 Araliya Red

Nuwara Eliya

4 Star Hotel.
Full board one night stay for 2 people.
Pool access

**Travel Period (1 Aug - 30 Sep)**

## #10 Pearl Bay

Bandaragama

Access to all games for 2 people
Splash Bay - Unlimited
Speed Bay -10mins
Target Bay - 10mins

**Travel Period (1 Aug - 30 Sep)**

Ticket Price :
**Rs. 5000.00**
Only lucky 2000 Tickets

We highly appreciate your active participation on this project for the successful completion and help your Alma-Meter.

Contact –
Buddhi – 0774128124
Molintha – 0777681814

## ආදි ශිෂ්‍ය සංගමයේ වාර්ෂික මහ සභා රැස්වීම 2024/03/20



## ආදි ශිෂ්‍ය කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරීමෙන් අනතුරුව විවෘත කිරීම



Graphic Designing & Page making
Digital මහගෙදර
Contact us - 071 316 5151

යා යුතු :-